HNB GRAMEEN

# මෙහෙවර

අඳුර දුරලන සොඳුරු මෙහෙවර

2017 ජූලි - අගෝස්තු කලාපය





2016 / 17 වසරේ හොඳම ශාඛාව ලෙස අභිසෙස් ලැබූ යාපනය ශාඛාවට අපගේ උණුසුම් සුභාශිංෂන







ජීවිතයට අරුතක්










# සිය දිවි නසා ගැනීමට තැත් කළ

# Harry Potter කතුවරිය

**ජෝන්** කැතලින් රෝලින් (JOANNE KATHLEEN ROWLING) වන ඇය 1965 ජූලි 31 දින එංගලන්තයේ ගමක උපත ලැබුවාය. රෝලින් ගැන අදින් වසර 20 ට පමණ පෙර කිසිවකු දැනගෙන සිටියේ නැත. නමුත් රෝලින් ගැන අද වනතෙක් ඔබත් නොදන්නවා විය හැක. ඔබම කල්පනා කර බලන්න කවුද මේ J. K. රෝලින් කියන්නෙ කියලා, ඔබට හුරු පුරුදු නමක් ද. ඇයට උවමනා වූයේ ඇයගේ නමට වඩා ඇය බිහිකල නාමයක් ලොවට දායාද කිරීමටයි. ඒ සඳහා ඇය තම දුක, කඳුළ, හැකියාව සියල්ල එකට මුසුකර නොවිඳිනා දුක් කන්දරාවක් ඉතා ආශාවෙන් විඳ එහි විපුල ඵල අද වන විට නෙලාගෙන හමාරය.

රෝලින්ගේ පියාගේ නම පීටර් ජේම්ස් රෝලින්ගස් විය. මවගේ නම ඈන්ය. මේ දෙපළ විවාහ වී වසර 2 ක් ගත වූ කල J. K. රෝලින්ගස් උපත ලැබීය. ඇයට ඩයනා නමින් සහෝදරියක් ද විය.

ඇය තමා උපන් ගමේම පාසලට ඇතුලත් විය. ඇය කුඩා කාලයේ කිසිදු ක්‍රීඩාවකට සම්බන්ධ නොවූ අතර ඉතා ලැජ්ජාශීලී චරිතයක් විය. නමුත් ඇය සාහිත්‍ය හැදෑරීමට ඉතා දැඩි කැමැත්තක් දැක්වූවාය. ඇය පාසල් කාලයේ දී අධ්‍යාපනය හොඳින් හැදෑරීය. පසුව ඇය ප්‍රංශ භාෂාව හැදෑරීම සඳහා විශ්ව විද්‍යාලයට ඇතුලත් විය. පසුව වසරක් ප්‍රංශයේ අධ්‍යාපනය හදාරන ලදී.

නැවත උපාධිය ලබාගත් පසුව ඇය ලන්ඩනයට නැවත පැමිණ ලේකම්වරියක් වීමට පුහුණු විය. නමුත් ඇයට එය සාර්ථක වෘත්තියක් නොවන බව පසුව ඇයම තීරණය කරන ලදී. නිරතුරුවම ඇයගේ සිහිනය වූයේ කථා ලිවීමයි. එම සිහිනය සමඟ ඇය නිරතුරුවම ජීවත් වූවාය. ඇය 1990 වසරේ දී මැන්චෙස්ටර් සිට ලන්ඩන් වලට දුම්රියෙන් ගමන් කරන අතර ඇගේ ජීවිතයේ පරිවර්තන සිතිවිල්ල පහළ විය. එම පරිවර්තන සිතුවිල්ල නිසා වසර කීපයක් තුළ දී ඇයටවත් සිතා ගන්නට බැරි ස්ථානයක ඇය නතර විය. එම ස්ථානය දෛවය විසින් ඇයට උරුම කරදුන් ස්ථානයක් නොව ඇය විසින්ම උදා කරගත් දෙයක් විය. ඇයට පහළ වූ අදහස වූයේ පිරිමි ළමයෙකු මන්ත්‍ර ගැන ඉගෙන ගැනීමට පාසලකට යන කථාවකි. රෝලින් තම වෘත්තීය ලෙස තෝරාගනු ලැබුවේ ගුරු වෘත්තියයි. තෝරාගත් විෂය වූයේ ඉංග්‍රීසි ඉගැන්වීමයි. 1992 දී ඇය පෘතුගාල ජාතික ජෝර්ජ් නමැති ජනමාධ්‍යවේදියෙකු සමඟ විවාහ විය. ඉන් වසරකට පසු ඔවුනට ''ජසිකා ඉසබෙල්'' නමින් දුවක් උපන්නාය. දරුවා උපත ලබා මාස කිහිපයක දී විවාහය දෙදරා ගොස් තම ස්වාමි පුරුෂයාගෙන් වෙන්වීමට ඇයට සිදුවිය. ඇය නැවත දරුවා සමඟ එංගලන්තයට පැමිණ ස්කොට්ලන්තයේම පදිංචියට පැමිණියාය. ඇය තමන්ගේ සහෝදරියගේ නිවසට ආසන්නයේ පදිංචි විය. ඇය හුදකලාව කුඩා දරුවා සමඟ ජීවත් වූ අතර ඇයට විෂාදය නැමති මානසික රෝගය වැලඳුනි. ඇයගේ පවුල් ජීවිතය කඩා වැටීම, දරුවකු ඉපදීම, ආදායම් මාර්ග අහිමි වීම වැනි හේතූන් නිසා මානසික අවපීඩනයකට ඇය පත්විය. එසේම ඇයට ජීවිතය නැතිකර ගැනීමට පවා සිත් විය. ඇයගේ පැවති මානසික පීඩනය සියදිවි නසා ගැනීමට මානසික මට්ටමක් ගොඩනැගීමට හේතු විය. ඇය ඇයගේ මානසික ආතතිය ඇය මනසින් ගොඩනැගූ කථාව ලිවීමට අවියක් කර ගන්නා ලදී. ඇයගේ මානසික පීඩාව ඇයගේ නිර්මාණශීලී කථාවට ඇයගේ පීඩනය මුසුකරන ලදී. ඇය ඇයගේ දුව අතින් අල්ලාගෙන ඇවිද්දවන අතරතුරදී පවා ඇය ලියන කථාව ගැන කරුණු සිතීය. ඇය ඇයගේ දුක, කඳුළු මුසුකර මානසික පීඩාවන්ගෙන් පෙළී සිටි කාලයේ ලියූ කථාව අවසානයේ ලෝක පූජිත කතාවක් බවට පත්විය. ඇයගේ සිහිනය මල්ඵල ගැන්වුනේ 1995 වසරේ දීය. ඇය එම ලියූ කථාව ටයිප් කළේ පැරණි අතින් ටයිප් කරන ටයිප් රයිටරයකිනි. ඇය ප්‍රකාශකයින් විශාල ප්‍රමාණයක් ගාවට ඇයගේ අත්පිටපතද රැගෙන යන ලදී. නමුත් ඇයගේ එම මුල් පිටපත සියළු දෙනාම ප්‍රතික්ෂේප කරන ලදී. ඇය තවදුරටත් මානසිකව ඇද වැටුනි. ඇය වසරකට වැඩි කාලයක් ප්‍රකාශකයකු සොයා ගැනීමට අපමන වෙහෙසක් ගත්තාය. අවසානයේ ඇයට බ්‍රයෝනි නමැති එතරම් ප්‍රසිද්ධියක් නොමැති සුළුවෙන් පොත් ප්‍රකාශනය කරගෙන යන ප්‍රකාශකයා හමුවිය.



ඇය සමඟ කථා කළ ඔහු එම පොතේ වටිනාකම තේරුම්ගෙන පොත මුද්‍රණය කර බෙදා හැරීමට කැමැත්ත පල කරන ලදී. ඇයට එම පොත වෙනුවෙන් අත්තිකාරම් මුදලක් ලෙස මුල්ම ගෙවීම ලෙස පවුම් 1500 ලැබිනි. එය ඇයගේ ප්‍රථම කුළුඳුල් නවකතාව විය. එය අන්කවරකවත් නොව පසුව ලෝක ප්‍රසිද්ධ වූ ''හැරී පෝටර්'' නව කතාවයි. හැරී පෝටර්ගේ මව එනම් කතුවරිය වන්නේ J. K. රෝලින්ග්ස්ය. ඇය නොවිඳිනා දුක් කම්කටොලු විඳ තමාගේ නවකතා සිහිනය 1997 ජූනි මාසයේ දී සැබෑවක්ම බවට පත්කර ගන්නා ලදී. මුල්ම මුද්‍රනය කළ පිටපත් සංඛ්‍යාව වූයේ දහසකි. ඉන් පිටපත් 500 පුස්තකාල වලට අළෙවි කරන ලදී. ඇය පසුව ලෝකයේම අවධානය දිනාගත් ළමා පොත් කතුවරිය බවට පත්විය. ඇයට එක දිගට තුන් වරක්ම NESTLE SMARTIES AWARD එක හිමිවිය. එය ඇය ලද අතිමහත් වූ ජයග්‍රහනයක් බව ඇය ඉතා නිහතමානීව පවසයි. ඇය ''හැරී පෝටර්'' පොත හරහා තම ආර්ථික ප්‍රශ්න සියල්ල ඉතා කෙටි කාලයක දී විසඳා ගන්නා ලදී. ඇය ජීවිතයේ දී ලද සියළු පරාජයන් හැරී පෝටර් නිසා ජයග්‍රහණයන්ට පරිවර්තනය කර ගැනීමට ඇයට හැකි විය. ඇයගේ 4 වන පොත වූ HARRY POTTER AND THE GOBLET OF FIRE පොත කලින් ලියන ලද පොත් 3 අභිබවා පිටපත් 372,000 අලෙවි විය. එය එක් දිනක දී සිදු වූ ආශ්චර්යයක් විය. මෙම පිටපත් අලෙවි වූයේ එංගලන්තයේ දීය. ඇ.එ.ජ. පැය 48 ක් තුළ මෙම පොත පිටපත් මිලියන 3 ක් අලෙවි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඇය 2000 වසරේ ''වසරේ කතුවරයා'' ලෙස ''BRITISH BOOK AWARD'' එක හිමි කර ගත්තාය.

ඇයගේ ජීවිතය එතැන් පටන් සුහද


ප්‍රේමසිරි ගමගේ
සභාපති, ව්‍යාපාර සංවර්ධන කේන්ද්‍රය.

04 වැනි පිටුවට

මතක තබා ගන්න දෙවියන්නට කිසිවක් කළ නොහැකි බව

# IQ MASTER
# දැනුමෙන් දිනුම ලැබූ ජයග්‍රහකයෝ

මැලේසියානු විදෙස් සංචාරයක් සහ මුදල් ත්‍යාගයක්,

රුපියල් මිලියන 2 ක හදිසි අනතුරු රක්ෂණාවරණයක්, රුපියල් ලක්ෂයක ජීවිත රක්ෂණාවරණයක් සමගින් ...

## IQ Master ජය අම්බලන්ගොඩ ශාඛාවේ තිලාන් සංජීවට

**රැකියාවට අදාල ධූරාවලීන්ට පමණක් සීමා නොවී තම කාර්යමණ්ඩලයට නවමු අත්දැකීම් එක්කරමින් සතුට විනෝදය සේම දැනුම කුසලතා ඔප් නංවා ගත හැකි තෘප්තිමත් සුන්දර ස්ථානයක් බවට රැකියා ස්ථානය පත්කිරීම HNB ග්‍රාමීන් හි මූලික අරමුණ වෙයි. තම ආයතනය සතු අගනාම වත්කම තම සේවකයන්ය යන්න තරයේ අදහන කළමනාකාර අධ්‍යක්ෂක තුමන් ඇතුළු සමාගමේ ඉහළ කළමනාකාරීත්වය හැකි සෑම මොහොතකම එම අභිප්‍රායන් සාධනය උදෙසා නව සංකල්ප හඳුන්වා දීමට පසුබට වන්නේ නැත. "IQ Master දැනුමෙන් දිනුම" එම සංකල්පයේ තවත් එක් සොඳුරු සන්ධිස්ථානයකි. තම කාර්ය මණ්ඩලය දැනුමෙන් සන්නද්ධ නව දැනුම සොයා යන පිරිසක් බවට පත්කිරීම එම සංකල්පයේ අරමුණ විය.**

IQ Master දැනුමෙන් දිනුම තරගයේ අවසාන මහා තරගය පසුගිය ජූනි 22 දා සවස HNB ග්‍රාමීන් ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරයේදී පැවැත්වුණේ තරගකරුවන් 15 දෙනකුන්ගේ සහභාගීත්වයෙනි. Fast the Finger Forst ප්‍රශ්න වටයන්ගෙන් තේරී IQ Master Hot Sheet එකට ගොඩවීමට සුදුසුකම් ලැබුවේ තරග කරුවන් පස් දෙනකු පමණි.එහෙත් ඒ කිසිවකුත් ප්‍රශ්න දහයටම පිළිතුරු දීමට අසමත් වූ නිසා තවත් තරගකරුවන් දෙදෙනෙකුට Hot Sheet අවස්ථාව ලබාදීමට අධීක්ෂණ මණ්ඩලය තීරණය කළේය. තරගය නිමා වූයේ වැඩිම ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු දුන් අම්බලන්ගොඩ ශාඛාවේ තිලාන් සංජීව මහතා ජයග්‍රහකයා ලෙස තේරීමෙනි. ජයග්‍රාහී තරගකරුට හිමිවන මැලේසියානු විදෙස් සංචාරය සහ රුපියල් ලක්ෂයක ජීවිත රක්ෂණාවරණයක් සහ රුපියල් මිලියන 2 ක හදිසි අනතුරු රක්ෂණාවරණයක් ජයග්‍රාහී තරගකරු දිනාගත් ත්‍යාග මුදලට අමතරව ඔහුට හිමිවිණි. අවසාන තරගය සඳහා පිළිතුරු දීමේ අවස්ථාව උදාකරගත් තරගකරුවන් පස්දෙනාහට ලක්ෂයක ජීවිත රක්ෂණාවරණයක් සහ හත් ලක්ෂ පනස් දාහක හදිසි අනතුරු රක්ෂණාවරණයක් ඔවුන් විසින් දිනාගත් ත්‍යාග මුදලට අමතරව හිමිවිණි.

මීට අමතරව අවසාන තරගය සඳහා සුදුසු කම් ලැබූ සියළුම තරගකරුවන්ට වටිනා සහතික පත්‍රයක්, රන් පදක්කමක් සහ රුපියල් ලක්ෂයක් වටිනා ජීවිත රක්ෂණ ආවරණයක් හිමි විණි.ප්‍රශ්න දහයටම පිළිතුරු සපයා මෙවර IQ Master කිරුළ දිනා ගැනීමට කිසිවකුටත් නොහැකි වූ අතර ලබන වසරේ IQ Master කිරුළ හිමි කර ගැන්මේ අභියෝගය ඔබ හමුවේ ඉතිරිව ඇත.■




දියුණු වීමට උගත්කම සහ දැනුම අනිවාර්ය බව මතක තබා ගන්න.

02 වැනි පිටුවෙන්

දිවියකට පරිවර්තනය විය. ඇයගේ සියළු ගැටළු ප්‍රශ්න ඇයගේම තනි කැපවීමෙන් උත්සාහයෙන් අන් අයගේ ද උදව් ඇතිව විසදාගැනීමට හැකියාව උදාකර ගන්නා ලදී. ඇය නැවතත් 2001 වසරේ දී නීල් මයිකල් නැමැත්තා සමඟ විවාහ දිවියට එළඹුනි. ඇය 2003 දී පුතකුත් 2005 දී නැවතත් දුවකුත් රටට දායාද කළාය. ඇයගේ අසහනකාරී ජීවිතය අවසන් වී අතිසුන්දර පවුල් ජීවිතයක් නැවතත් ඇය උදාකර ගත්තාය.

ඇයගේ ජීවිතය සහමුලින්ම වෙනස් කලේ ඇයගේ හැරී පෝටර් පොත කීවොත් එය නිවැරදිය. ඇය 2008 වසරේ දී SUNDAY TIMES පුවත් පත මඟින් එංගලන්තයේ සිටින ඉහළම ධනවතුන් අතරින් 144 වන ස්ථානයේ J. K. රෝලින්සන්ව නම් කර ඇත.

ඇය 2000 වසරේ දී පවුම් මිලියන 5.1 යොදවා අරමුදලක් ද ගොඩ නගන ලදී. එය පිහිටවනු ලැබුවේ ස්වාමිපුරුෂයින් අහිමි වූ කාන්තාවන් සහ දරුවන් සඳහා ය. ඒ අයට උදව් කිරීමේ අරමුණින් එම සංවිධානය පිහිටුවන ලදී. ඇයගේ දුක් ජීවිතය අන් අයට අත් නොවිළීමට ඇය එම සංවිධානය පිහිටු වීමට හේතු විය.

ඇයගේ අද වන විට ප්‍රධාන අභිලාෂය ඇයගේ පවුල වෙනුවෙන් කාලය වෙන් කිරීම වුවත් ඉන් ලද අවස්ථා වලදී දරුවන් වෙනුවෙන් කථා ලිවීමට ඇය කෙසේ හෝ කාලය වෙන් කරන බවයි.

ඇය අදවන විට ඇයගේ ආර්ථික ප්‍රශ්න මෙන්ම පවුල් ජීවිතය ද අතිශයින් සාර්ථකත්වයට පත් කර ගෙන ඇත.

ඔබට මට අප සැමටම නිරතුරු ප්‍රශ්න කරදර වලට මුහුන දීමට සිදුවේ. නමුත් තමන්ගේ ජීවිත අරමුණ අමතක නොකර තමන්ගේ ගැටළු කෙසේ හෝ විසඳා ගෙන ජීවිත අරමුණු ඉටු කර ගැනීමට ශක්තිය ඇති කර ගන්න.

## අඳුර සහ මම

අඳුරට ආදරය කළෙ එළියක් නැති හින්දා
අඳුරට හුරු වීය එළියට බය හින්දා
එළියෙන් එළිය දැක ගන්නට බැරි හින්දා
අඳුරෙහි එළිය මම දුටුවෙමි ඒ හින්දා

මලෙහි සුවඳ කොතරම් සුන්දර වූවත්
එමලෙහි දසුන දැක ගන්නට බැරි වූවත්
සුවදට ආදරය කළෙමි සැමදා වූවත්
දසුනට වෛර නොකළෙමි මම කවදාවත්

ගල් කැට පයෙහි ඇණෙනා කටුකය ගතට
නින්දත් සුව නොවේ මගෙ අසරණ කමට
කල්යල් බලා පෙන්විය හැකි ලෙස ඔබට
මා ලිව්වෙමි දුක් කවියක් සුමට කොට

ලක්ෂාන් මධුශංක නගර ශාඛාව

## වැස්ස වළාහක දෙවියනි

ඉරිතලා ගිය පොළොව දන කැල
සුසුම් හෙළුවේ නැතිව වැසි පොද
අසිරි මල් වැසි ඉසිනසේ ඔබආවේ
තුට දී සනසමින් හද
කුරිරු වීලා නොසිතූ ලෙස ඔබ
දුන්න මහ වැසි පුරා ජල කඳ
විසදුවා ඉරණම සැමගෙ මොහොතකින්
අවුළුවා සෝසුසම් හද

නිහඬ වුවත් ඔබ තවම නිහඬ නෑ
හැම හදකම ගිනි ඇවිලෙනවා
දරුවන් අහිමිව මව්පිය අහිමිව
තවමත් දුක් කදුලැලි බොනවා
පස් කදු පෙරලී ගේ දොර සමගින්
අසරණ දන මිහිදන් වෙනවා
වැස්ස වළාහක දෙවියනි වළකනු
මෙවන් විපත් දොස් හැර පලවා

-ඩී. ඒ. චාලට් විජයසිරි
ඉසුරුපුර මධ්‍යස්ථානය ජ හොරණ



# පහන් තැව

## නොනවතින ප්‍රශ්න

දැනුමෙන් දිනුම
තරගේ
පුටුවට වඩා රස්නෙයි
දහසක් ප්‍රශ්න වලට
උත්තර හොයන
බෝඩිමේ ඇඳ

-චන්න දයාප්‍රිය සිල්වා
අම්බලන්ගොඩ ශාඛාව

## දැකුම් මඟ

දහමින් සිත් වැඩේ ගුණවත් ඉතා හොඳ
මිනිසුන් ලෙසින් සිතතෝත් අපි හැමෝ මද
මෙත් කරුණා ගුණය සහ මුදිතා දියද
සිහිකර උපේක්ෂා ගුණයෙන් වෙසෙමු හොඳ

සිල් නැණ ගුණ සුවද පිරි දරුවනගෙ සිත
කිසිවිට වැරදි පිළිවෙතකට නැමුණෙ නැත
කෙරුවොත් සමාජෙට උපරිම පරිදි සෙත
නාමය සදා කාලික ලෙස දිලෙනු ඇත

දම්පද හදාරා මෙමඟින් සියළු දෙන
ගුණබර දහම් දිවි පෙවෙතක අගය දැන
ලෝකයෙ ලස්සනද විසිතුර දකින පින
හිමිකර දෙමු සුරැක බුදුහිමි දෙසුව බණ

-නිමල් රාජකරුණා

# සුභ මංගලම්



**HNB** ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ් හි නුවර ශාඛාවේ කල්බදු අංශයේ මෙත්ම කරලියද්ද මහතා ගංගා විජේවර්ධන මෙනෙවිය සමඟ නව යුගදිවි ගමන් ඇරඹුවේ පසුගිය මැයි මස 19 වෙනි දිනය. සුන්දර යුගදිවියකට **HNB** ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ සහෝදර නිළධාරි මඩුල්ලේ සුභාශිංෂණ ඔබ දෙපලට අපි මෙසේ පිළිගන්වමු.



**HNB** ග්‍රාමීන්
ඇඹිලිපිටිය ශාඛාවේ සේවයේ
නියුතුව සිට අප අතරින් සමුගත්
**දයාබර මාලක නිශාන්ත**
සොයුරා වෙනුවෙනි

දසවසක් පුරාවට ඔබේ ජව යෞවනය
කැපකරන් දස දහස් වූ දෙනා ගොඩගන්න
අව් වැසිද මහ ශීත කුණාටුත්
පසුකළා මතක මල් පිපිදුනා
රඹකැන්පුරය සතරදිග...
ඒ සොඳුරු **නිශාන්තය**
වියැකිලා දියවෙලා ගලාගිය
කඳුළු කැට
අපේ නෙත් අතර සිරවෙලා
නුඹ අපෙන් වෙන් වුනද
ඒ මතක සුවඳ කෙත සදාකල් පවතීවි
එවිට නුඹ අප මිතුර නිවන් මග සැනසේවි...

සොවින් තැවෙන...
HNB ග්‍රාමීන් සමස්ථ සේවක මණ්ඩලය

කිසිම ප්‍රශ්නයක් නැතිව දවස ගෙවුනාද? එසේනම් ඔබට කොහේ හෝ වැරදී ඇත.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය (Cash flow Statement)

ව්‍යාපාරයක් සඳහා ණය මුදලක් නිකුත් කිරීමට පෙර ණය භාර නිලධාරියා විසින් අදාල ව්‍යාපාරිකයාගේ ආදායම් ප්‍රකාශය (income statement) පිළිබඳව විමසිලිමත් වීමේ ඇති වැදගත් කම පිළිබඳව සහ එහි දී අවධානයට ලක් කරනු ලබන ප්‍රධාන අංශ කීපයක් පිළිබඳව පසුගිය කලාපයෙන් අපි සාකච්ඡා කළෙමු. මෙවර අපගේ අවධානය යොමු වන්නේ ආදායම් ප්‍රකාශය සේම වැදගත් වන්නා වූ තවත් අංශ කීපයක් සම්බන්ධයෙනි.

## මුදල් ප්‍රවාහය (Cash flow)




ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරයන් සඳහා ණය මුදලක් නිකුත් කිරීමේ දී ණයභාර නිලධාරියාගේ අවධානය යොමු විය යුතු වැදගත්ම අංශයක් වන්නේ ණය ඉල්ලුම් කරුගේ ව්‍යාපාරයේ මුදල් ප්‍රවාහය (Cash flow) කෙසේ සිදුවන්නේ ද යන්න පිළිබඳවයි. මේ තුළින් අදාල ණය ඉල්ලුම්කරුගේ ව්‍යාපාරයේ ආදායම් වියදම් තත්වයන් ඉතා හොඳින් විශ්ලේෂණය කිරීමට ණය භාර නිලධාරියාට හැකියාව ලැබේ. මෙහි දී ඔහුට මුදල් ලැබෙන්නේ මාසිකවද වාර්ෂිකවද, මුදල් වලින් කොපමණ ලැබෙනවා ද, චෙක්පත් මඟින් ගෙවීම් සිදුවන ප්‍රමාණය කොපමණද?, කොපමණ මුදල් ප්‍රමාණයක් ඉතිරි කරනවද මේ ආදී වශයෙන් වු සියළුම තොරතුරු මුදල් ප්‍රවාහ (cash flow) විශ්ලේෂණය මඟින් අනාවරණය කර ගත හැකිය.
එසේම ඉහත දත්ත විශ්ලේෂණය තුළින් තමන් විසින් අදාල ණය ඉල්ලුම්කරුට ලබා දෙන ණය මුදල කොතෙක්ද යන්න පිළිබඳවත් ණය භාර නිලධාරියාට යම් අදහසක් ලබා ගත හැකිය. මෙසේ ව්‍යාපාරයේ මුදල් ප්‍රවාහය විශ්ලේෂණය කර බැලීමෙන් ඉක්බිති නිකුත් කරන ණය මුදල ''cash flow Base Lending ''(මුදල් ප්‍රවාහය මත ලබා දෙන ණය) යනුවෙන් හඳුන්වනු ලබයි. තම මූල්‍ය ආයතනය ණය නිකුත් කිරීමේ දී දරනු ලබන අවධානම (risk) අවම කර ගැනීමට ව්‍යාපාරයක මුදල් ප්‍රවාහය සිදුවන ආකාරය විමසා බැලීම ණය භාර නිලධාරීයාගේ වගකීමක් වන්නේ ය.

අප එසේ පවසන්නේ මේ තුළින් ව්‍යාපාරය තුළ කාලීනව සිදුවන වෙනස්කම්, ඒ ඒ කාලයට අනුව ව්‍යාපාරයේ සිදුවන ආදායම් වියදම්හි විෂමතා, ඒ අනුව ණය නැවත ගෙවීමේ දී ගනුදෙනුකරුට සිදුවිය හැකි අපහසුතා ආදී සෑම අංශයක් පිළිබඳවම නිවැරදි තක්සේරුවක් ණයභාර නිලධාරියාට ලබා ගත හැකිය. මේ නිසාම ක්ෂුද්‍ර මූල්‍ය ණය නිකුත් කිරීමේ දී ණය භාර නිලධාරියා විසින් අදාල ගනුදෙනුකරුවාගේ CASH FLOW එක (මුදල් ප්‍රවාහය) පිළිබඳව අවම වශයෙන් වසරකවත් දත්ත විශ්ලේෂණය කර බලා ඒ පිළිබඳව වාර්තාවක් සැකසීම ඉතා වැදගත් බව මෙහි දී අවධාරණය කෙරේ.
අදාල ව්‍යාපාරයේ මුදල් ප්‍රවාහය සිදුවන අන්දම ගැන වාර්තාව පිළියෙල කිරීමේ දී ණය ඉල්ලුම් කරු ලබා දෙන දත්ත, ඔහුගේ ආදායම් වාර්තා, ව්‍යාපාරයේ ස්වභාවය මත සිදුවිය හැකි අනාගත අනුමාන ආදී අංශ ගණනාවක් පිළිබඳව ණය භාර නිලධාරියාගේ අවධානය යොමු විය යුතුය.
මෙහි දී මේ පිළිබඳව විමර්ශනය කොට ණය භාර නිලධාරියා විසින් සකස් කරන ලද මූදල් ප්‍රවාහය පිළිබඳ විශ්ලේෂණ වාර්තාව මාසයෙන් මාසයට ව්‍යාපාරයේ ආදායම් වියදම් සොයාගත හැකිවන අන්දමට කොටස් කරගත යුතුය.
එසේම අදාල ගනුදෙනුකරු ව්‍යාපාරයේ වර්තමාන සහ අතීත වාර්තා මත පදනම් කර ගනිමින් ව්‍යාපාරයේ අනාගත තත්වයන් පිළිබඳ කරනු ලබන අනුමාන මත පදනම්ව තවත් විශ්ලේෂණ වාර්තාවක් පිළියෙල කිරීමේ වගකීම ණය භාර නිලධාරියාට පැවරේ. එහි දී ගනුදෙනුකරුගේ ඉදිරි ආදායම් සහ වියදම් පිළිබඳව විමසිලිමත්වෙමින් ඒ අනුව විශ්ලේෂණ වාර්තාව පිළියෙල කිරීම කළ යුතුය.
එම වාර්තාව අනුව අදාල ගනුදෙනුකරුගේ ව්‍යාපාරයේ ඉදිරි පැවැත්ම කෙබඳුද යන්න පිළිබඳ දළ අදහසක් අදාල ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයට ලබා ගත හැකිය. එසේම ණය ඉල්ලුම්කරු සම්බන්ධයෙන් ඇති වෙනත් ආදායම් මාර්ග පිළිබඳව ද ණය භාර නිලධාරියාගේ අවධානය යොමුවිය යුතුය.
ගනුදෙනුකරුගේ ආදායම් වියදම් තත්වයන් විමසීමට ලක් කිරීමෙන් අනතුරුව අදාල ගනුදෙනු කරුගේ ඉතුරුම් සඳහා වූ හැකියාව සොයා බලා ඔහුව ඒ සඳහා පොළඹවාලීමේ වගකීම ද ණය භාර



නිලධාරියාට පැවරේ.
මෙසේ ව්‍යාපාරයේ සෑම අංශයක්ම සම්බන්ධයෙන් ණයභාර නිලධාරියා විසින් සිදුකරන ලද විමර්ශන මත පදනම්ව සකස් කරන ලද මුදල් ප්‍රවාහ විශ්ලේෂණ වාර්තාව (cash flow statement) සැලකිල්ලට ගනිමින් අදාල ක්ෂුද්‍ර මූල්‍ය ආයතනය මඟින් ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන ණය මුදල කොතෙක්ද යන්න තීරණය කරනු ලබයි.



HNB ග්‍රාමීන් ෆිනෑන්ස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිළධාරී චමින්ද ප්‍රභාත් මහතා සමග කළ සාකච්ඡාවක් ඇසුරිනි.

මෙහි දී විශේෂයෙන් අවධාරණය කළ යුතු කරුණක් වන්නේ ණය භාර නිලධාරියා නොසැලකිලිමත් කමින් හෝ අදාල ගනුදෙනු කරු සමඟ පවත්නා හිතවත්කම් මත පදනම්ව නිවැරදි දත්ත ඉදිරිපත් නොකරන්නේ නම් එසේත් නැතිනම් තම ආයතනික ඉලක්ක සපුරා ගැනීම පිළිබඳව සැලකිලිමත් වෙමින් සාවාද්‍ය වාර්තා, ඉදිරිපත් කළහොත් එහි අනිටු ප්‍රතිවිපාකයන්ට අදාල මූල්‍ය ආයතනයට සේම ණය භාර නිලධාරියාට ද මුහුණ දීමට සිදු වේ. ඒ අනුව වගකීමෙන් යුතු මූල්‍ය කළමනාකරණයට අනුව යමින් විශ්ලේෂණ වාර්තා සැකසීමට ණය භාර නිලධාරියාගේ අවධානය යොමු විය යුතුය.







අපේ ගෙදර

# බිරිඳකට තම සැමියගේ රාජකාරිය ගැන නිවැරදි අවබෝධයක් තියෙන්න ඕන...

HNB ග්‍රාමීන් පවුලේ අපි මිතුරන් සේම සැම විටෙකම සොහොයුරන් සොයුරියන් සේ එක්ව බැඳුනෝ වෙමු. ග්‍රාමීන් සමාගම සතු එක් ශක්තියක් වූයේද අප එකිනෙකා අතර වූ එම අන්‍යෝන්‍ය බැඳීමම වේ. අප අප අතර පමණක් නොව ඒ ළබැඳියාව අප පවුල් අතරද දූ දරුවන් අතරද එකසේ වර්ධනය වනු දැක්ම ග්‍රාමීන් පැතුමයි. අද සිට අප අරඹන "අපේ ගෙදර" විශේෂාංගයද ඒ සඳහා වූ එක් පියවරකි. නිවසත් කාර්යාලයත් අතර වූ ඔබේ ජීවිතයේ බැඳීම් ඔබේ ජීවිතයට අතිශයින්ම කිට්ටුවන්ත වූ සමීපතමයාගේ ඇසින් දකින්නට අපි දරන වෑයමයි මේ.

බණ්ඩාරගම පිළියන්දල පාරේ කඹුරුගොඩ හන්දියෙන් හැරී පාසැල පාරේ මද දුරක් ඉදිරියට ගමන් කරන අපට ඉසුරු උයනේ අංක 115/2 දරන නිවස සොයා ගැනීම එතරම් අපහසුවක් නොවූයේ ඔහු පැවසූ මග විස්තර වලටත් වඩා ඔහු පිළිබඳව විමසූවන්ගෙන් අසා ගත් මග විස්තර වඩාත් නිරවුල් වූ නිසාය. HNB ග්‍රාමීන් සමාගම තුළ සේම ප්‍රදේශයේ කා අතරත් ජනප්‍රිය චරිතයක් වූ කොළඹ ප්‍රාදේශිකය භාර ප්‍රාදේශීය කළමනාකරු සුජිත් කුමාරගේ ගෙදර මෙවර "අපේ ගෙදරට" ප්‍රස්තුතය සපයයි.

දූ සිඟිත්තියකගේ දයාබර පියකු වූ සුජිත්ගේ සෙනෙහෙබර කැදැල්ල හැඩ වැඩ කෙරුනේ ඔහු ගේ ප්‍රිය බිරිඳ නදිකා ගීතාංජලී ගේ දෑතිනි. ග්‍රාමීන් සමාගමට උරුමවූ කාර්ය බහුලත්වය මැද අතිශය කාර්ය බහුල ප්‍රාදේශීය කළමනාකරුවෙකු වූ සුජිත්ගෙන් ගෙදර වැඩවලට ලැබෙන උදව් කොයි වගේද අපි ඇහුවේ ගීතාංජලීගෙන්

ඇය සිනාසුනා.. ඊළඟට මෙහෙම කිව්වා..

"එයාව ගෙදර වැඩවලට හවුල් කර ගන්නවා කියන්නේ ඒක කෙරෙන වැඩක් නෙවෙයි.ඇත්තටම වෘත්තීය ජීවිතය තුළ තියෙන කාර්ය බහුලත්වයත් එක්ක මම එහෙම බලාපොරොත්තු වෙන එකත් වැරදියි. ඔෆිස් වැඩක් නොතිබුනොත් සෙනසුරාදා ඉරිදා සුජිත් අයියා සම්පූර්ණයෙන්ම අපිත් එක්කම දවස ගත කරනවා.වැඩිපුරම දුවගේ වැඩ, එයාව පංතිවලට ගෙනියන ඒවා, එක්කන් එන ඒවා එදාට එයා කරනවා. සතියෙ දවස් ටිකේ නම් ඒ වැඩ ටික සේරම මගේ අතින් තමයි කෙරෙන්නෙ".

පවුලෙ කට්ටියත් එක්ක යන්න දාගෙන හිටිය මඟුල්ගෙයක්, විනෝදගමනක් වගේ දෙයක් හදිසි රාජකාරිමය හේතුවක් නිසා අවලංගු කරන්න වෙච්ච අවස්ථා නැද්ද

"එහෙම අවස්ථා නැත්තෙම නෑ. සුජිත් අයියා නිතරම සැලසුමක් එක්ක වැඩ කරන කෙනෙක්. එයාට එහෙම රාජකාරිමය කටයුතු වැටිලා තියෙන දවස් ගැන එයා කල් තියා මට කියනවා. ඒ නිසා හුගක් වෙලාවට රාජකාරියයි පෞද්ගලික ජීවිතෙයි පටලවා ගන්නෙ නැතිව අවබෝධයකින් යුතුව කටයුතු කරන්න පුළුවන් වෙලා තියෙනවා.අනෙක බිරිඳක් නිතරම තමන්ගේ සැමියගේ රාජකාරියේ ස්වාභාවය ගැන නිවැරදි අවබෝධයකින් ඉන්න ඕන, සුජිත් අයියට එයාගේ රාජකාරියත් එක්ක හවස 5,6 වෙද්දි ගෙදර එන්න බෑ කියලා මම දන්නවා. අපි ජීවිතේ ලබපු හැම දෙයක්ම අපි ලබාගත්තේ එයාගෙ රැකියාව නිසා කියන එක මම දන්නවා වගේම ඒ වෙනුවෙන් අපි යම් කැප කිරීමකුත් කළ යුතුයි කියලා මම හිතනවා".

ගීතාංජලී බිරිඳක් මවක් ලෙසින් සිය යුතුකම් ඉටුකරන අතරේම ලේඛිකාවක් ලෙසත් සිය කුසලතා එළි දක්වන්නට උත්සාහ කරන්නියක්. ඇගේ හැකියාවන් එළි දක්වන්නට සැමියාගෙන් ලැබෙන සහය මොන වගේද... අපේ කතා බහ මැදට නොපනින්නට කල්තියා වුණු පොරොන්දුව අකුරට රකිමින් සුජිත් මුණිවත රකිද්දි ගීතාංජලී සිය හැඟීම් මේ විදිහට වචන වලට පෙරළුවා

"මම ඉස්කෝලෙ යන කාලෙ ඉඳලම ලියන්න ආසයි. මගේ මුල්ම පොත නෙතු කඳුළු ලිව්වෙ 2006 අවුරුද්දෙ. එතකොට අපි බැඳලා නෑ. මගේ අත් පිටපත කියවලා සුජිත් අයියා කිව්වා අපි මේක මුද්‍රණය කරමු කියලා. එයා එදා එහෙම කිව්වට මම හිතුවෙ නෑ සුජිත් අයියා ඒක කොහොම හරි කරයි කියලා. ඒ වෙනුවෙන් හුගක් මහන්සි වෙලා ප්‍රකාශන ආයතනයකුත් හොයාගෙන ඒ පොත් මුද්‍රණය කළා . ඒ 2008 අවුරුද්ද. අපි බැඳලා දුව ලැබෙන්න හිටියා.2008 මැයි මාසෙදි පොත මුද්‍රණය වුණා . මගේ බලාපොරොත්තු ඉටු කරන්න ඔහු ගත්තු මහන්සිය මට මහමෙරක් වගේ දැණුනා. නෙතු කඳුළු අබිරහස් නවකතාවක් විදිහටයි ලියවුණේ. මේ දවස් වල මගේ දෙවෙනි පොත ලියමින් ඉන්නවා. ඒක නම් ආදර කතාවක්. පොත ලියලා ඉවරවෙනකම් මටත් වඩා නොඉවසිල්ලෙන් ඉන්නෙ සුජිත් අයියා.

ලංකාවේ, වැඩ කරන්න යොග්‍යතම සමාගම් අතරින් මුල් පෙළේ HNB ග්‍රාමීන් සමාගමත් ඉන්නවා. මේ ජයග්‍රහනය ඔබට දැනෙන්නෙ කොහොමද

සුජිත් අයියා මේ ගැන ගෙදර ඇවිත් කියලා හුගක් සතුටු වුණා. ආයතනය හොද මට්ටමක තිබිලා 2009 වගේ කාලේ වෙද්දි කඩා වැටිලා ආපහු පෙර තිබුණු මට්ටමටත් වඩා ඉහළට ආපු එක මේ ආයතනයත් එක්ක දිගටම හිටපු අපිට හීනයක් වගේ. තමන්ගේ කාර්ය මණ්ඩලයට වෘත්තීය මට්ටමෙන් වගේම සමාජීය මට්ටමෙනුත් පිළිගැනීමක් සහ උසස් තත්වයක් ලැබීමට මග පෑදීම ආයතනයක කළමනාකාරීත්වයේ වගකීමක්. ඒ වගකීම HNB ග්‍රාමීන් සමාගමේ කළමනාකාරීත්වය ඉහළින්ම ඉටුකර තිබීම මේ වගේ සම්මානයකින් පිදුම් ලැබීමට හේතු වෙන්න ඇති. අපි පාරෙ බැහැලා යද්දි මිනිස්සුන්ගෙන් සුජිත් අයියට ලැබෙන සැලකිල්ල සහ පිළිගැනීම දිහා බැලුවහම මේ රැකියාව ඒ ආයතනයේ සේවකයන්ට කොච්චර තෘප්තිමත් එකක්ද කියලා මට වුණත් දැනෙනවා.

දිගු දවසක නිමාවෙ තවත් අළුත් දවසකට ආරාධනා කරමින් හිරු අවරෙහි ගිලී යමින් තිබුණා. හෙට එළඹෙන අළුත් දවස ඔබට මට මෙන්ම ඔවුන්ටත් සුබදායී එකක් වේවී. ඔවුන්ගේ සොඳුරු කැදැල්ලෙන් සමුගන්නට අපි අවසර පතද්දි ගීතාංජලී ඇය ලියූ මේ කව අප අතට පත් කළේ පිටුවෙන් පුංචි ඉඩක් ඒ වෙනුවෙනුත් වෙන් කරන මෙන් ඉල්ලමින්.■

පන්හිඳට අකුරු කරනට
වදන් මදි වූ නුඹේ සෙනෙහස
සදාකල් ලැගුම්ගත් මගේ හදවතේහි
නේකවර ලියවුනි සදා නොමැකෙන සේ...
ඉදින්.. ඒ නොමැකෙන.. ඒ ආදරණීය වූ
සොඳුරුතම සෙනෙහසේ
හිමිකාරිය වන්නට
තවත් යුග ගණනකට
අවසරද හිමියනේ
ඔය දෙපා මුල රැඳෙන්නට...

සාකච්ඡාකළේ
මංජුල හෙට්ටිආරච්චි

# ගී කියන මාළුන්ගෙන් මග අසාගෙන අපි කල්ලඩි පාලම පසුකළෙමු...






HNB ග්‍රාමීන් මඩකලපුව ශාඛාව

මඩකලපුව ශාඛාවේ කාර්ය මණ්ඩලය



ටී. ශ්‍රී කාන්ත් ප්‍රාදේශීය කළමනාකරු | අජිත් ප්‍රියන්ත කළමනාකරු මූල්‍ය සහ අනුකූලතා (ප්‍රාදේශීය) | බාලසුබ්‍රමනියම් ක්‍රිශාන්ත් ශාඛාකළමනාකරු | ඒ. රදීෂ් සහකාර කළමනාකරු | ටී. නිශාන්තන් ශාඛා මූල්‍ය ප්‍රධානී | එන්. රුද්‍ර කුමාර් ක්ෂේත්‍ර කළමනාකරු | එස්. ගුණසේකරම් ක්ෂේත්‍ර කළමනාකරු

**කල්ලඩි පාලම යට සිංදු කියන මාළුන් පිළිබඳ අපි විවිධ පුරාවෘත්ත අසා ඇත්තෙමු. බැලූ බැලූ අත දිස්වන නිල්වන් මහා සයුර මඩකලපුවට ගෙන එනුයේ විචිත්‍රත්වයකි. කල්ලඩි පාලමද මහා සයුරද අදටත් එදා සේමය. එහෙත් මුළු පුරවරයම නිදිගත් නිශ්ශබ්ද හෝරාවක කල්ලඩි පාලම යට සිංදු කියූ මාළුවන්ගේ ගී හඬ අද නැත. ජාතීන් අතර ඇවිලුණු යුධගිනි දැල් මැද තවදුරටත් රැඳෙනු නොහී උන් පලාගොස් ඇති සැටියකි.**

අපි මඩකලපුවට සේන්දු වන විට සවස තුන පසුවෙමින් තිබිණ. වළා පිරුණු අහස් වියනට උඩින් තද හිරුගේ රැස් කලපුවට පතිතවන්නේ හිරු රැස් කදම්බයන් (sun beam) කලපුව මත විත්‍රනය කරමිනි. මෙවන් සොඳුරුතාවයන්ගෙන් පරිපූර්ණ මඩකලපුවට ග්‍රාමීන් සම්ප්‍රාප්තිය සිදුවන්නේ 2003 වසරේ දීය. ''සෙල්වනායගම් වීදිය, මඩකලපුව'' ලිපිනයේ ආරම්භ වුණු ග්‍රාමීන් මඩකලපුව ශාඛාව කලින් කලට ස්ථාන කිහිපයකටම මාරුවෙමින් අද වන විට අංක 39/1 සෙන්ට්‍රල් පාර මඩකලපුව ලිපිනයේ ස්ථාපිතව ඇත.

මඩකලපුව ශාඛාවේ ශාඛා කළමනාකාරු බාලසුබ්‍රමනියම් ක්‍රිශාන්තන්ය. ඔහුගේ ද්‍රවිඩ භාෂාවත් මගේ සිංහලයත් විසින් අප අතර සන්නිවේදන ගැටලු මතු කරද්දී ශ්‍රීකාන්ත්, මඩකලපුව ප්‍රාදේශීය කළමනාකරතුමන් සිය ද්විභාෂා හැකියාව එම බාධකයට පිළිතුරක් බවට පත්කරන්නට ඉදිරිපත් විය.

''මේ පළාතේ වැඩිම ජනගහනයක් ඉන්නේ ද්‍රවිඩ ජනතාව. ඒ 72% ක්. 25.49% මුස්ලිම් අය ඉන්නවා. සිංහල අය ඉන්නේ 1.17% වගේ ප්‍රමාණයක්. තව වෙනත් ජාතීනුත් දශම ගාණක් ඉන්නවා. මඩකලපුව නගරය ගත්තාම වෙළෙඳාම තමයි මූලික. ඇඳුම් කඩ හුඟක් තියෙනවා. සමහර වීදිවලට ගියාම ඩුබායි ගියා වගේ. වැඩිපුරම කලපු ආශ්‍රිත ධීවර කර්මාන්තයේ නියැලුණු අය ඉන්නවා ඊට අමතරව ගොවිතැන්, මැටි කර්මාන්තය, කජු වගාව, තල් ආශ්‍රිත නිෂ්පාදන, සත්ව පාලනය බහුලව දැකිය හැකියි.

HNB ග්‍රාමීන් සමාගම මේ සෑම ව්‍යාපාරයකටම තම සේවාවන් සපයනවා. ලංකාවේ දුප්පත්ම ජනතාවක් වෙසෙන දිස්ත්‍රික්ක අතරින් මඩකලපුවට හිමිවන්නේ මුල්තැනක්. මේ නිසාම අපේ ආයතනය පිළිබඳව මේ ප්‍රදේශයේ ජනතාව තුළ වැඩි ආකර්ශනයක් තියෙනවා. මොකද ඉතාම අවම කොන්දේසි මත වත්කම් ඇප නොසලකා ඔවුන්ගේ ව්‍යාපාර සඳහා අපි ලබාදෙන ණය මුදල ඔවුන්ට ඔවුන්ගේ ජීවිත ගිලගත් දරිද්‍රතාවයෙන් මුදවාගැනීමට කදිම අත්වාරුවක් වෙලා තියෙනවා.

මේ වන විට මඩකලපුව HNB ග්‍රාමීන් ශාඛාව මඟින් කොළඹ පාරේ වාලච්චේන පුනානේ දක්වාත් කල්මුනේ පැත්තෙන් කලවන්චිකුඩි දක්වාත් ත්‍රිකුණාමලය පැත්තට වාකරේ දක්වාත් වූ ප්‍රදේශ ආවරණය කරමින් HNB ග්‍රාමීන් මධ්‍යස්ථානය හරහා අපගේ සේවාවන් ලබා දෙනවා. මඩකලපුව ශාඛාව මඟින් ආවරණය කළ නොහැකි ප්‍රදේශ ආවරණය කිරීමට මඩකලපුව ශාඛාව යටතේ අපි කල්මුනේ සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනවා. 2012 ජූලි 06 වෙනිදා එම සේවා මධ්‍යස්ථානය ආරම්භ කළා. කල්මුනේ සේවා මධ්‍යස්ථානය යටතේ මාන්ගාඩු, තිරුක්කෝවිල්, දක්වා වූ ප්‍රදේශ වල ව්‍යාපාර කරනු ලබන ජනතාවට ණය පහසුකම් සලසා දෙනවා.

මඩකලපුවේ මේ වෙද්දී පිළිගත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන තිහක් විතර තියෙනවා. ඊට අමතරව ක්ෂුද්‍ර මූල්‍ය සේවා සපයන කුඩා ආයතන 300 විතර දකින්න පුළුවන්. මෙපමණ ණය දෙන ආයතන තිබියදීත් HNB ග්‍රාමීන් වටා ඒකරාශී වූ විශාල සංඛ්‍යාවක් ගනුදෙනු කරුවන් පිරිසක් සිටින්නේ ඔවුන් අප කෙරේ තබා ඇති විශ්වාසය නිසයි. විශේෂයෙන් අප විසින් සපයනු ලබන සහනශීලී සේවාවන් සහ සුහදශීලීත්වයට ඔවුන් ගරුකරනවා වගේම එය ඔවුන්ට පහසුවක්.

මීට අවුරුදු දාහතරකට විතර කලින් අපෙන් ණය ගත්තු පිරිස් තවමත් අපි එක්ක ඉන්නවා. ඒ වගේම කටින් කට ගිය ප්‍රචාරය ඔස්සේ අලුතින් පිරිස් HNB ග්‍රාමීන් සමාගම වටා ඒකරාශී වෙනවා ඔවුන්ගේ ව්‍යාපාර ගොඩ නගා ගන්න. අපි ණය දීම විතරක් නෙවෙයි අපේ ගනුදෙනු කරුවන් සඳහා පුහුණු වැඩසටහන් සහ ප්‍රදේශය වෙනුවෙන් කළ හැකි සමාජ සත්කාර ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් දියත් කර ජනතාව සමඟ සිටින ආයතනයක් ය යන හැඟීම ප්‍රදේශයේ ජනතාව තුළ තහවුරු කරලා තියෙනවා.

**ශ්‍රීකාන්තන්ගේ හැඳින්වීම සැබෑවක්ය යන්න තවදුරටත් තහවුරු කරමින් ලංකාවේ හොඳම HNB ග්‍රාමීන් ශාඛාවන් අතරින් දෙවන ස්ථානය දිනා ගැනීමට මඩකලපුව ශාඛාවට මෙවර හැකි වූ බව අප මෙහි සටහන් කොට තබන්නේ "මෙහෙවර" හෘදයාංගම සුබපැතුම් ද සමඟිනි.**

කල්මුනේ සේවා මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය



HNB ග්‍රාමීන් කල්මුනේ සේවා මධ්‍යස්ථානය




**සටහන - මංජුල හෙට්ටිආරච්චි**
**ජායාරූප - සුරංග කුරුප්පුආරච්චි**



ටී. රගු කළමනාකරු | කේ. තෝමස්වෙල් සහකාර කළමනාකරු



යෝගානන්දන් සුදර්ශන් විධායක මූල්‍ය සහ පරිපාලන | කේ. ප්‍රශාන්ත් කණිෂ්ඨ සහකාර කළමනාකරු - (ක්ෂුද්‍ර මූල්‍ය) | එන්. ප්‍රියදර්ශන් කණිෂ්ඨ සහකාර කළමනාකරු - (ක්ෂුද්‍ර මූල්‍ය)



ආරාධිත අමුත්තන්ගේ සම්ප්‍රාප්තිය




කළමනාකාර අධ්‍යක්ෂතුමන් උත්සව සභාව අමතමින්



වසරේ නැගී එන හොඳම ශා









ක්‍රීඩා කටයුතු නගා සිටුවීම වෙනුවෙන් පිරිනැමෙන විශේෂ සම්මානය උෂාන්ට

පැහැදුල් නිල්වන් අහස් 
බර ඝනඳුරු අහසෙක රන් 
ග්‍රාමීන් අපටද අඳවන වි
කුසක් හිමිය. පසුගිය ජුලි 0
අඹරෙහි කැළුම් විහිදුවා
වර්ණ රන් තාරකා අතරි
තාරකා සම්මාන ප්‍රසාද
සුදීප්තිමත් විය. ඒ ඔවුන් 
රන් අස්වනු ලෙස හැඳින්වි
ඇවන්ඩ්‍රාගාර්ඩන් හිදී HN
රැය කැළුම් විහිදුවාලූ අ
කාවයන්හි මෙ




නි.සාමාන්‍යාධිකාරී රුවන් ප්‍රනාන්දු මහතා පිළිගැනීමේ කථාව කරමින්



හොඳම අළෙවි විධායක (සුළු පරිමාණ ව්‍යාපාර) සම්මානය මයුරන්ට




නැගී එන ක්ෂුද්‍ර මූල්‍ය ණය නිළධාරීවරයා - ප්‍රශාන්තන්




දස වස සැපිරූ සේවක අබිමන






හොඳම ක්ෂුද්‍ර මූල්‍ය ණය විධායක - සන්ජීත්




හොඳම ප්‍රාදේශීය කළමනාකරු
ගාමිණි



...ව - මන්නාරම ශාඛාව



වසරේ හොඳම ශාඛාව දෙවෙනි ස්ථානය - මඩකලපුව ශාඛාවට






ග්‍රාමීන් කලා කුසලතා වේදිකාව විචිත්‍රවත් කරමින්



වසරේ හොඳම ශාඛාව තුන්වෙනි ස්ථානය නුවර එළියට






Night of Stars සංවිධාන කමිටුව



HNB ග්‍රාමීන් ක්‍රිකට් කණ්ඩායම ඇගයීමට පාත්‍ර වෙමින්

...ක මීස වැහි වලාවන්ගෙන් ...රු බබලන්නේ නැත. HNB ...සුපැහැදිලි සුවිසල් අහස් ...වනදා රැයෙහි HNB ග්‍රාමීන් ...දහස් ගණනක් වූ ස්වර්ණ ...වඩාත් පැහැදුල් දීප්තිමත් ...පාත්‍රවෙමින් තව තවත් ...ළු රන් දහබිඳු මතින් පිඳුනු ...වඩාත් නිවැරදිය. මීගමුව ...ග්‍රාමීන් Night of Star තරු ...රු අප කැමරා ශිල්පීන්ගේ ...සටහන්වී තිබිණි.







ක්ලිෆඩ් - ප්‍රියන්තිකානි Night of Stars මෙහෙයවමින්



වසරක ඇගයුමක සතුටු නිමාව

ඔබට ඊර්ෂියා කරන අයට වෛර නොකරන්න. ඔවුන් එසේ කරන්නේ ඔබ ඔවුන්ට වඩා ඉදිරියෙන් සිටින නිසාය.

## ණය ගන්න මට වෙනත් මූල්‍ය ආයතන අවශ්‍ය වුනේ නෑ....



- මයිල්වාගනම් පරමේශ්වරී 6 කණුව ඩඩ්ඩිමුඩාන් පාර නැදුන්කර්ණි -

මම අවුරුදු පහක ඉඳන්ම කරන්නේ මේ ව්‍යාපාරය. ගස්ලබු, රටකජු, මිරිස්, කෙසෙල්, පැෂන්ෆෲට් වගේ බෝග වර්ග ගණනාවක් අපි මේ අක්කර දෙකක් පමණ වන ප්‍රදේශයක වගා කරනවා. අපේ නිෂ්පාදන මිල දී ගන්න වෙළෙන්දෝ ගොවි බිම් වලට එන නිසා අපිට මේවා විකුණාගන්න අමතර මහන්සියක් වෙන්න ඕන නෑ. මීට අවුරුද්දකට විතර කලින් මම ග්‍රාමීන් එකට සම්බන්ධ වෙලා රු. 50,000 ණය මුදලක් ගත්තා. මොකද වගාව පටන් ගන්න කාලෙට අපිට සෑහෙන මුදලක් අවශ්‍ය වෙනවා. ණය මුදල් ගන්න වෙන්නේ ඒ නිසයි. ග්‍රාමින් එකත් එක්ක සම්බන්ධ වුණාට පස්සේ මම වෙන මූල්‍ය ආයතනයක් එක්ක සම්බන්ධ වුනේ නෑ ණය ගන්න. මොකද ඉතාම හොඳ හිතවත් සේවාවක් ග්‍රාමීන් එකේ සර්ලගෙන් අපිට ලැබෙනවා. දැන් මම ඉන්නේ ලක්ෂයේ ණය මුදලේ. වගාවක් හොඳට කරගෙන තව කිපදෙනෙකුට රැකියා අවස්ථාවනුත් සපයලා දීලා අපේ ජිවිත සාර්ථකව ගත කරන්න HNB ග්‍රාමීන් සමාගමෙන් ලැබුණු අත්වැලට අපි කෘතඥ්ඥ විය යුතුයි.

ජය වැඩ අබියස

## අවුරුදු පහක් පුරාම ඒ නොබිදුණු විශ්වාසයත් එක්ක අපි ගනුදෙනු කරනවා.

කාලෙවානෙයිගේ ගේ ඉදිරිපස පාර දිගේ ඇවිද යන්නෙකුගේ දෑස් ඇගේ ගේ ඉදිරිපසට දිවයන්නේ නොසිතාමය. පිළිස්සෙන කජු වලින් නැගෙන නැහැතුඩු කිතිකවන පුසුඹ විසින් සේම ගේ ඉදිරිපස වූ කුඩා කඩ කෑල්ලේ එල්ලන ලද පැකට් වල දුඹුරු පැහැයෙන් හා සුදු පැහැයෙන් බැබලෙන කජු මද අපිට ඇගේ ව්‍යාපාරය පිළිබඳව ගොළුබසින් කියාපාන්නා සේය.

''ව්‍යාපාරය පටන් අරන් අවුරුදු 17 වෙනවා. අපි කජු වේලලා තලලා රෝස්ට් කරන්නෙත් මෙහේමයි. කජු වතුවලට ගිහින් කජු මිලදී ගන්න නිසා අපිට යම් ලාභයක් ඇතිව මේ ව්‍යාපාරය කරන්න පුළුවන්.



T. කලෙවානෙයි නාගපූර්මි, මහුලුර්

දවසකට කජු කිලෝ දහයක් විතර අපි රෝස්ට් කරනවා. මේ කටයුතු වලට මා ලඟ තව තුන්දෙනෙක් සේවය කරනවා. මම HNB ග්‍රාමීන් එකට සම්බන්ධ වෙන්නේ ව්‍යාපාරයට අවශ්‍ය මුදල් ඉතා පහසුවෙන් හා ඉල්ලුම් කරන වෙලාවට ලබා ගැනිමට හැකි නිසයි. අවුරුදු පහක් පුරාම ඒ නොබිඳුණු විශ්වාසයත් එක්ක අපි ගනුදෙනු කරනවා.

## "මගේ ව්‍යාපාරය දියුණු කරගන්න උදව් වුණේ ස්වශක්ති ඉතුරුම් ක්‍රමයයි".

අභයපුර අලිවංගුව පාසැල ආසන්නයේ පිහිටා ඇති නිශාන්ත ඩ්‍රෙස් පොයින්ට් ඇගලුම් ප්‍රදර්ශනාගාරය ප්‍රදේශයේ හැටියට සැලකිය යුතු මට්ටමේ එකකි. දුෂ්කරතාවන්ගෙන් හා අඩු පහසුකම් වලින් යුත් ප්‍රදේශයේ මෙවන් වෙළෙඳසැලක වටිනාකම එම ප්‍රදේශයේ වෙසෙන්නන්ට ඉහටත් උඩින්ය.

''මේ වෙළෙඳසැල මම පටන් ගත්තේ 2012 දී. ව්‍යාපාරයට අවශ්‍ය ඇගළුම් ගෙනාවේ මම කොළඹින්. මෙහෙන් වාහනයක් කතා කරගෙන ගිහින් ඇඳුම් ගේන එක පාඩුයි. මම උදේට බස් එකේ කොළඹ ගිහින් ඇඳුම් මිලදී අරගෙන ඒවා පදවි ශ්‍රී පුර බස් එකක දාගෙන අරන් ආවා. ඒක හුගක් මහන්සි වැඩක් වුණත් වෙන කරන්න දෙයක් තිබුණේ නෑ. මම මේ අතරේ ග්‍රාමීන් සමාගමේ ඉතුරුම් ගිණුමක් විවෘත කරලා ඉතුරුම් කරගෙන ගියා. මගේ



- E. A. ප්‍රදීප් නිශාන්ත, නිශාන්ත ඩ්‍රෙස්පොයින්ට් අලිවංගුව, පාසැල අසල පදවි ශ්‍රී පුර -

ව්‍යාපාරය දියුණු කරගන්න උදව් වුණොත් ඒ ඉතුරුමමයි. ග්‍රාමීන් සමාගම හඳුන්වාදුන්නු ස්වශක්ති ණය ක්‍රමය හරහා ඉතා පහසුවෙන් කිසිදු ඇපයක් නැතිව මගේ ඉතුරුමේ ශේෂයට අනුව ණය මුදලක් ගන්න මට පුළුවන් වුණා. ණය මුදල් ආපසු ගෙවද්දි පවා මට ග්‍රාමීන් සමාගමට යන්න අවශ්‍ය වුනේ නෑ. මොකද සතිපතා ග්‍රාමීන් එකේ සර්ලා අපි ලඟටම ඇවිත් ණය වාරික අරගන්නවා. මම මුලින්ම රු. 50,000 ණය මුදලක් අරගත්තා. ඉන් පස්සේ 150,000 ණය මුදලක් ස්වශක්ති ණය ක්‍රමයෙන් අරගත්තා. ඊළගට රු. ලක්ෂ 2 ක ණය මුදල ලබා ගැනිමයි බලාපොරොත්තුව. ස්වශක්ති ණය ක්‍රමය හරහා ග්‍රාමීන් සමාගම අපිව ඉතුරුම්වලට පොළඹවන අතරෙම ඒ ඔස්සේ ඉතා පහසුවෙන් ව්‍යාපාරික ණය මුදලක් ලබා ගැනීමේ අවස්ථාවක් සලසා දී තිබීම මොන තරම් පහසුවක් ද.

මම ව්‍යාපාරයක් විදිහට මී කිරි නිෂ්පාදනය පටන් අරන් දැන් අවුරුද්දක් විතර වෙනවා. ඊට කලින් මම කරපු සිල්ලර කඩ ව්‍යාපාරය ඒ තරම් සාර්ථක නොවුණු නිසා එම ව්‍යාපාරය අත්හැර දමන්න වුණා. ඉන් පස්සේ ග්‍රාමීන් සමාගමෙන් දිරිය ණය මුදලක් අරන් මී කිරි නිෂ්පාදනය පටන් ගත්තා. අවුරුදු පහක විතර කාලයක් පුරා මම ග්‍රාමීන් සමාගමේ සාමාජිකාවක්. මගේ මුල් ව්‍යාපාරය අඩාල වෙද්දි මට කළ හැකි වෙනත් ව්‍යාපාරයක් ගැන උනන්දු කලේ ග්‍රාමීන් එකේ සර්ලා. ඒ අනුව මම මී කිරි මුදවා අලෙවි කිරීමේ ව්‍යාපාරය පටන් ගත්තා. මම කිරි ගන්නේ පිටින්. දවසකට කිරි හට්ටි 150 ක් විතර හදනවා."අර්මාර් කිරි" වෙළෙඳ නාමය යටතේ අපේ මී කිරි බෙදා හැරීම කරන්නේ මහත්තයා. රු. 25,000 ණය මුදලේ ඉඳලා ලක්ෂ එකහමාර දක්වා ණය මුදල් මම ග්‍රාමීන් සමාගමෙන් අරන් තියෙනවා. එදා ඉඳලා අද දක්වා අපේ ව්‍යාපාරික අවශ්‍යතා වලට අපි ලග ඉන්නේ ග්‍රාමීන් සමාගම.




N. තිරුමලර් ඊච්චන්තිව් නවක්කාඩු.

**හැම දෙනාම සතුටු කරන්නට යා මෙන් ඔබට දියුණුවක් දැකිය නොහැකිය.**

# HNB ග්‍රාමින් තරු රැයේ කැළුම් විහිද වූ තරු

**HNB ග්‍රාමින් සමාගමේ Night of Stars 2016/17** වාර්ෂික ප්‍රගති සමාලෝචන හමුව පසුගිය ජුලි 01 වෙනිදා අති මහත් උත්කර්ෂවත් අන්දමින් පවත්වන්ට යෙදුණේ වසරක් තුළ විවිධ අංශයන්ගෙන් කුසලතා දැක්වූවන් සම්මානනීයන් බවට පත්කරමිනුයි. එක් දහස් හයසියයකට අධික වූ සේවක පිරිසක් අතරින් මෙලෙස ඇගයීමට ලක්වීම සැබැවින්ම ඔවුන් සතු කැප වීම සහ කුසලතාව ප්‍රකට කිරීමක් ලෙස හඳුන්වාදිය හැකියි. එදින ඇගයුම් සම්මාන ප්‍රසාදයට පාත්‍ර වූ සියල්ලන්ටම **HNB** ග්‍රාමින් පවුලේ සුභාෂිංශන පිරිනමන අතරම ඔවුන් අතරින් හොඳම අලෙවි විධායකවරුන් ලෙස තේරුණු අප සහෘදයන් කිහිපදෙනකුන් සිය වෘත්තීය අරමුණු සඵල කරගැන්ම සඳහා වූ වෙහෙස මහන්සිය පිළිබඳව මෙහෙවරට අදහස් දැක්වූයේ මෙසේය.



**HNB** ග්‍රාමින් සමාගමට අභිනවයෙන් එක්වූ මූල්‍ය සේවාව වන්නේ කල්බදු සේවාවය. ආරම්භ කර ගතවූ කෙටි කාල පරාසය තුළ ඉතා විශිෂ්ඨ ජව සම්පන්න ගමනක නිරත වන කල්බදු අංශයේ 100 අධික තරුණ නිළධාරීන් අතරින් හොඳම අලෙවි විධායක (කල්බදු) වරයා ලෙස සම්මානයට පාත්‍ර වූයේ අනුරාධපුර ශාඛාවේ කල්බදු අංශයේ අලෙවි විධායක වරයා වූ චන්දන බණ්ඩාර මහතායි.

මම ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වුනේ 2015 අවුරුද්දෙ. මීට කලින් මම මේ ක්ෂේත්‍රයට සම්බන්ධ වෙනත් ආයතන කිහිපයකම රැකියාව කරලා තියෙනවා. ඒ ලබපු අත්දැකීම් සහ ගොඩනගාගෙන තිබූ සම්බන්ධතා ඔස්සේ මට ලැබී තිබූ ඉලක්කය සම්පූර්ණ කරන්න මට අපහසු වුනේ නෑ. අනෙක අපේ අංශයේ ඉහළ කළමනාකාරිත්වයෙන් ලැබුණු සහයෝගය. **HNB** ග්‍රාමින් කල්බදු අංශය අලුතින් පටන් ගත්තු නිසා තවමත් වෙළෙඳ පොළේ වැඩි ඉඩක් අපිට ලැබිලා නෑ. මේනිසා පසුගිය කාලය පුරාම තනි තනි වශයෙන් වගේම කණ්ඩාමක් විදිහටත් අපි අපේ වෙළෙඳ පොළ ප්‍රවර්ධනය සඳහායි වැඩී ඉඩක් වෙන්කළේ. ඒ අතරෙම මට ලැබී තිබුණු ඉලක්කය වගේ 144% ක ප්‍රමාණයක් කරන්නත් මට පුළුවන් වුණා.



දිවයින පුරා විසිරුණු 65 ආසන්න ඉතුරුම් විධායකයින් අතරින් හොඳම අලෙවි විධායක (ඉතුරුම්) ලෙස තේරුණේ බදුල්ල ශාඛාවේ ඉතුරුම් අලෙවි විධායකයා වූ චින්තක මධුශාන් මහතායි. මේ ඔහු සිය ඉලක්ක කරා ගමන් ගත් අන්දමයි.

මම ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වෙලා අවුරුදු දෙකහමාරක් වෙනවා. මීට කලින් රැකියා කිහිපයක්ම කරලා අන්තිමට රජයේ බැංකුවක සේවය කරමින් ඉන්න අතරේ තමයි ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වුනේ. **HNB** ග්‍රාමීන් ඉතුරුම් තවමත් ලොකුවට ව්‍යාප්ත වෙලා නැති නිසා ප්‍රවර්ධන කටයුතු හරහා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් වලට තමයි මුල්තැනක් දුන්නේ . මම කලින් මූල්‍ය ආයතනයක සේවය කරලා ඒ ලබපු අත්දැකීම් සහ ගොඩනගාගෙන තිබූ ගනුදෙනුකරුවන් පිරිසගෙ සහය මෙතැනදී මට හුගක් උපකාරී වුණා. ඊට අමතරව අපි ගනුදෙනුකරුවන් සඳහා ලබාදෙන සේවාව පිළිබඳව ඔවුන් තෘප්තිමත් නම් ඔවුන් අපි එක්ක රැඳෙනවා.මට ලැබුණු ණය ඉලක්කය ට වඩා 130% ක් කරන්න මේ අවුරුද්දෙ මට පුළුවන් වුණා. මේ වගේ අපිව ඇගයීමට ලක්කිරීමත් එක්ක තව තවත් උනන්දුවෙන් කටයුතු කරන්න ආශාවක් ඉබේම ඇතිවෙනවා.




ග්‍රාමීන් සමාගමේ මූල්‍ය ශක්තිය නංවාලීමෙහිලා ඉතා විශාල කාර්ය භාරයක් ඉටු කරන කුඩා කණ්ඩායමක් අප අතර සිටිනවා . තම සේවා දායකයා සොයා ගොස් ඔවුන් වෙත තම සේවාව සපයමින් **HNB** ග්‍රාමීන් සමාගමට අමිල මෙහෙවරක් ඉටුකරන **HNB** ග්‍රාමීන් ස්ථාවර තැන්පතු අංශයේ හොඳම අලෙවි විධායකවරයා ලෙස මෙවර ඇගයීමට පාත්‍ර වූයේ ඩිශාන් සමින්ද මහතායි.

මේ මගේ දෙවෙනි රැකියා ස්ථානය.2013 ජුලි 01 වෙනිදා මම ග්‍රාමීන් සමාගමේ රැකියාවට ආවේ.හරියටම ඊට අවුරුදු හතරකට පස්සේ 2017 ජුලි 01 වෙනිදා හොඳම අලෙවි විධායක වරයා වෙන්න ලැබීම දෛවෝපගත දෙයක් විදිහටයි මම සලකන්නේ. **HNB** බැංකුවේ ශක්තියත් අප ලබාදෙන සේවාව සහ තරගකාරී පොළී අනුපාතයත් නිසා පෙරට වැඩි ආකර්ශනයක් අපේ ගනුදෙනුකරුවන් අතර රඳවා ගන්න **HNB** ග්‍රාමීන් සමාගමට හැකිවෙලා තියෙනවා. අප විසින් කරන අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් වලට අමතරව ගනුදෙනුකරුවන් සොයා ගොස් කරන දැනුවත් කිරීම් ඔස්සේ අළුත් ගනුදෙනුකරුවන් පිරිසක් සොයා ගන්න මම නිතරම කටයුතු කරනවා. මේ ජයග්‍රහනය ඒ මහන්සියේ ප්‍රතිඵලයක්.




පෞද්ගලික ආයතනයක සේවකයකුට නිවාඩු 28 ක් හිමියි . ඒ නිවාඩු 28 න් එකක්වත් විතරක් නෙවෙයි අඩුම වශයෙන් කෙටි නිවාඩුවක්වත් නොගෙන කවදාවත් එක තත්පරයක්වත් පමා නොවී සේවයට පැමිණීමට තරම් ප්‍රවේශම් වූ හරි අපූරු පුද්ගලයෙක් **HNB** ග්‍රාමීන් සේවක මණ්ඩලයේ සිටී. 2015 වසරේදීත් හොඳම පැමිණීමට හිමි සම්මානය දිනා ගත් ඔහු ත්‍රිකුණාමලය ශාඛාවේ ටී. ජේයවිනෝදන් නම් වෙයි.

ඔෆිස් එකේ ඉඳලා මගේ ගෙදරට කි.මී. 15 තියෙනවා. මම ග්‍රාමීන් එකට සේවයට ඇවිත් දැන් අවුරුදු හතරහමාරක් වෙනවා. මේ මුළු කාලය පුරාම මම උත්සාහ කළේ උදේ 8.00 , 8.10 අතරෙ සේවයට වාර්තා කරන්න. හැබැයි හොඳම පැමිණීමට හිමි සම්මානය දිනා ගන්නා අදහසක් කවදාවත් මගේ හිතේ තිබුණෙ නෑ. මම ඉස්කෝලෙ යන කාලෙත් එක දිනක් වත් වරද්දන්නෙ නැතිව පාසැලට යාමේ පුරුද්දක් මට තිබුණා.ඒ පුරුද්ද දිගටම පවත්වගෙන ආපු නිසා වෙන්න ඇති අසනීප ගතියක් තිබුණත් වැඩට නොයා ඉන්න මට හිතෙන්නෙ නැත්තේ. ඉදිරියෙදිත් නිවාඩු වලට ජීවිතයේ ඉඩක් නොදෙන්න මම පුළුවන් තරම් උත්සාහ කරනවා.



ඉදිරියේදී ගණකාධිකාරිවරයෙකු වීමයි මගේ අරමුණ. මේ විදිහට මාව ඇගයීමට ලක්කිරීම ගැන මට තියෙන්නෙ ඒ හැම දෙයක් ගැනම තව තවත් උනන්දු වෙන්න හිතෙන සතුටක්.

සඳට ඉලක්ක කරන්න. ඉලක්කය වැරදුනහොත් අවම වශයෙන් ඔබ තරු අතර හෝ රැඳේවි.



පහේ පන්තියේ දී තවදුරටත් සරෝජාව පාසල් යැවීම තේරුමක් නැති කටයුත්තක් යැයි තීරණය කළ ඇගේ දෙමාපියෝ සරෝජාව ගෙදර නවත්වා ගත්තේ ගෙදර තිබුණු අගහිඟකම් සහ වියදම් අඩුකර ගැනීමට ගත හැකි පිළියමක් ලෙසයි. එතැන් සිට ගෙදර නැවතී තම නංගිලා මලලිලා බලාකියා ගැනීම පුංචි සරෝජාට පැවරුණු රාජකාරියක් විය. හාල්මෝලක ගණන් තබන්නෙකු ලෙස රැකියාව කළ තාත්තාට නිව්මෝනියාව වැළඳී මියයන විට සරෝජාට යාන්තම් 16 වෙනි විය සපිරුණා පමණි. ගෙදර පිහිටට තිබුණු එකම ආදායම් මාර්ගයත් අහිමිව ගිය ඉක්බිති කුමක් හෝ රස්සාවක් කොට ගෙදර ආර්ථිකයට ශක්තියක් වීමේ වගකීම සරෝජා පිට පැටවුණේ අම්මා ද අසනීප ගතියෙන් පෙළෙන්නියක වීම නිසාය.

''ඒ කාලේ කල්මුණේ නැප්පට්මුනෙ ගමේ අත් යන්ත්‍ර වැඩපළවල් කීපයක්ම තිබුණා. මම තීරණය කළා අපේ ගෙවල් ළඟම තිබුණ අත්යන්ත්‍ර වැඩ පළට වැඩට යන්න. මම මුලින්ම ඒකට ගිහින් වැඩ පුරුදු වුණා. කාලයක් යද්දි මට එතැනම රස්සාව හම්බවුණා. කරන කෑලි ගානට අපිට ගෙව්වා. ඒ ලැබුණු මුදල පවුලක් නඩත්තු කරන්න තරම් ප්‍රමාණවත් නැති වුණත් අපි පුළුවන් විදිහට පිරිමහ ගත්තා.

තාත්තාගේ වියෝවෙන් වසරකට පසු හෘදයාබාධයකින් සරෝජාගේ අම්මා ද නැතිවුණේ ජීවිතයට තිබූ එකම හයියද අහිමි කරමිනි. එතැන් සිට පවුලේ සියලු බර පැටවුණේ සරෝජාගේ කරමතය.

මම අත්යන්ත්‍ර වැඩපලේ වැඩ කරලා මගේ නංගිලා මල්ලිලාව බලා ගත්තා. මම අවුරුදු 20 දී විවාහ වුණා. මහත්තයා වෙද මහත්තයෙක්. ඒත් මම මගේ රස්සාව නැවැත්තුවේ නෑ. ටික දවසකින් මම අත්යන්ත්‍රයක් මිලදී අරන් ගෙදර ඉදන් ඇදුම් වියන්න පටන් ගත්තා. මම ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වුණෙත් ඔය කාලෙමයි. ජීවිතේ පුරාම නොයෙකුත් දුක්වින්ද මට අගහිගකම ලැබෙන දේ අරපිරිමැස්මෙන් පාවිච්චි කිරීම වගේ දේවල් නුහුරු වුනේ නෑ. ඒ නිසාම ණය මුදලක් ගත්තත් ඒක අදාල දේටම යොදවනවා මිසක් ඒකෙන් වෙනත් වැඩ කලේ නෑ. එක මැෂිමෙන් මේ ව්‍යාපාරය පටන් ගත්තු මා ළඟ අද මැෂින් දහයකට වඩා තියෙනවා. ඒ වගේම විසිපස් දෙනෙකුට මා ළඟ රැකියාවල් දෙන්න පුළුවන් වෙලා තියෙනවා.

මම ග්‍රාමීන් සමාගමෙන් ගත්තු හැම ණය මුදලකින්ම කලේ මැෂින් එකක් ගත්තු එක. මට මතකයි මීට අවුරුදු පහකට කලින් රු. 30000 ණය මුදලක් අරගත්තා. ඒ මගේ පළවෙනි ණය මුදල මේ වගේ ගත්තු සෑම ණය මුදලකටම මම මැෂින් එකක් අරගත්තා. අන්තිමට ගත්තේ රු. 150,000 ණය මුදල. මේ තාක් මේ ව්‍යාපාරය දියුණු කර ගන්න **HNB** ග්‍රාමීන් සමාගමෙන් ලැබුණු උදව්ව මට කවදාකවත් අමතක කරන්න බෑ. මොකද ග්‍රාමීන් සමාගම හැමදාමත් අපිට සැලකුවේ එකම ලෙන්ගතුකමකින්. ඒක ගනුදෙනුවකට එහා ගිය නෑදෑකමක් වගේ දෙයක්. අද තවත් පිරිසකට රැකියාවල් දීලා මේ මට්ටමෙන් ව්‍යාපාරය පවත්වාගෙන ගියාට මම මේක පටන් ගත්තු විදිහ මට ඊට උදව් කළ අය කවදාවත් අමතක වෙන්නේ නෑ.

# එක මැෂිමකින් පටන් ගත්තු මගේ ව්‍යාපාරය මැෂින් දහයක් දක්වා අද දියුණු වෙලා...





## සරෝජනී කියන ඇගේ දියුණුවේ කතාව අසන්න



දැඩි නියගයකට ඔරොත්තු දෙන පතොක් ගස තම කටු අතර මල් පුබුදුවන්නේ තමා එතෙක් විඳි කටුකත්වය ජයග්‍රාහී සිනාවකින් සරසන්නා සේය. මහ සයුරේ හිරු බැස යමින් තිබේ. රාස්සිගේ අව්ව මතින් එක්වනම කඩා පාත්වුණ මහාවරුසාව කල්මුනේ සිට මඩකලපුව බලා යන අප මාර්ගය පුරා වැහි බිදු වගුරවන්නේ තාර පාරේ වැහිමල් පුබුදුවමිනි. ක්ෂණිකව පතිතව ඇදී මැකී යන වැහි මලට වඩා කටුක්තවයේ දාහය මුදුනේ පිපි පතොක් මල් සරෝජනීලාගේ කඳුළු සිනාසේම සුන්දර නොවේද?

සටහන
මංජුල හෙට්ටිආරච්චි
- ඡායාරූප -
සුරංග කුරුප්පුආරච්චි

හැකි කළ හොඳින් මහන්සි වී වැඩ කරන්න. නොහැකි කල හම්බ කළ දෙයින් යැපෙන්න






# ඔබ (NO) දන්න මම

## සුදේශ් චතුරංග
### කළමනාකරු මූල්‍ය සහ අනුකූලතා (ප්‍රාදේශීය)

- **සම්පූර්න නම** :- අමරවීර නාතාවිච්ගේ සුදේශ් චතුරංග

- **උපන් දිනය (කැමති නම්)** :- 1983.09.17 පාසල් කාලයේ ඔබේ ප්‍රියතම

- **පාසැල** :- මම පාසැල් දෙකකට ගියා. එකක් මගේ ගමේ ,වලස්මුල්ලේ ජුලම්පිටිය මහා විද්‍යාලය අනෙක කටුවන ජාතික පාසැල. ජුලම්පිටිය විද්‍යාලයට මම සාමාන්‍ය පෙළට වෙනකම් ගියා. අපේ ගෙදර ඉඳන් පාසැලට තිබුණේ කි.මී. එකහමාරක් විතර. උදේ 6.30 වෙද්දි අපි ඉස්කෝලෙ.ආපහු ඉස්කෝලෙ ඇරිලා ගෙදර එනකොට තුන හතර වෙනවා. පාසැල් කාලයට අමතරව ගෙවුණු හැම මොහොතක්ම අපි ගෙවුවෙ පිට්ටනියෙ. කටුවන විද්‍යාලයෙදි ඉගෙනීමට මුල්තැනක් දුන්නා. ඒත් ජීවිතේ අදටත් මතක් කරන්න පුළුවන් රස මතක ගොන්නක් ජුලම්පිටිය මහා විද්‍යාලය විසින් මගේ මතකයේ ඉතිරි කරලා තියෙනවා.

- **විෂය** :- ව්‍යාපාර අධ්‍යයනය විෂයට මම කැමතියි

- **ක්‍රීඩාව** :- පාසැලේදී මම ක්‍රිකට් කණ්ඩායමේ සාමාජිකයෙක්ව පාසැල වෙනුවෙන් ක්‍රීඩා කළා. ඒ වගේම මීටර් 400, 800, 1500 ඉසව් සඳහා පාසැල නියෝජනය කළා. මේ දෙකෙන් මම ක්‍රිකට් ක්‍රීඩාවට වඩාත් කැමැතියි.

- **පාසැල් කාලයේදී ලොකු වුණාම වෙන්න හිතන් හිටියේ** :- පුංචි කාලේ අම්මත් එක්ක ඉදහිටක බැංකුවට ගිය අවස්ථාවල ඉඳලා පස්සෙ තේරෙන කාලෙදිත් බැංකුවට ගියාම ඒ පරිසරය තුළ මට දැනුනෙ මහා ගාම්භීර කමක්. මේ නිසාම වෙන්න ඇති ලොකු වුණාම බැංකුවක රැකියාවක් කරන්න මගේ හිතේ ආශාවක් තිබුණේ.

- **මුල්ම රැකියාව සහ වඩාත්ම ආශාවෙන් කළ රැකියාව** :- මම 2003 දි උසස්පෙළ කරලා මාස කීපයකින් කාගීල්ස් ප්‍රධාන කාර්යාලයේ ගිණුම් සහායකයෙක් විදිහට රැකියාවක් කළා.ඒ රස්සාව අවුරුද්දයි මාස පහක් විතර කළා.ඒ අතරෙදී මම සෙලාන් බැංකුවටයි ග්‍රාමීන් එකටයි ඉන්ටර්වීව් ගියා. 2005දී ග්‍රාමීන් එකේ රස්සාව මට ලැබුණා හම්බන්තොට ශාඛාවේ ගිණුම් සහායකයෙක් විදිහට. ග්‍රාමීන් එකේ වැඩට ඇවිත් සති තුනකින් සෙලාන් බැංකුවේ ප්‍රධාන කාර්යාලයට මට පත්වීමක් ලැබුණා. ඒත් ඒකට මට යන්න හිත දුන්නේ නෑ. ග්‍රාමීන් එකේ පරිසරය සහ ගමටම ලැබුණු පත්වීම නිසා වෙන්න ඇති. එදා ඉඳන් අද දක්වාම මේ රස්සාව මම බොහෝම ආදරයෙන් සහ කැමැත්තෙන් කරනවා.

- **ජීවිතේ අමතක නොවන සිද්ධිය** :- 2011 තිස්ස ශාඛාවේ වැඩ කරද්දි බැංකුවට ඇවිත් ආපහු යද්දි මෝටර් බයිසිකලේ ඇක්සිඩන්ට් වෙලා මගේ නිකට ගොඩක් ඩැමේජ් වුණා . මට මතක විදිහට මැහුම් අටක් දැම්මා. මේ සිද්ධිය ගැන මම ගෙදරටවත් කිව්වේ නෑ. ගෙදර අය දැනගත්තෙ මගේ නිකටෙ කැළලෙන්. අදටත් ඒ කැළල මගේ නිකටෙ තියෙනවා.

- **ජීවිතේ වඩාත්ම සතුටට පත්වුණු දිනය සහ දුකට පත්වුණු දිනය** :- වඩාත්ම සතුටට පත්වුණු අවස්ථා දෙකක් තියෙනවා.එකක් මගේ උසස්පෙළ ප්‍රතිඵල ආපු දවස. විභාගයෙන් හොඳම ප්‍රතිඵල මට තිබුණා . රුහුණු විශ්ව විද්‍යාලයට තේරුණත් ගෙදර තිබුණු ප්‍රශ්නත් එක්ක මම ඒ අවස්ථාව කැප කළා. අනික තමයි 2017 දී හොඳම කළමනාකරු මූල්‍ය සහ අනුකූලතා (ප්‍රාදේශීය) විදිහට ලැබුණු ඇගයීම . ඒක ඒ මොහොත වෙනතුරුත් මම නොදැන සිටි පුදුමයක්. දුකක් දැණුනෙ මගේ නංගි විවාහ වෙලා ගිය දවසේ තව ඇඹිලිපිටිය ශාඛාවේ මාලකගේ වියෝවත් මගේ සිත හුගක් කම්පනයට පත්කළා.

## ඒ රාත්‍රිය මාව පුදුමයට පත්කළා...

- **අතීතයට යාමට වරමක් ලැබුනොත් ඔබ තෝරාගන්නා ජීවිතේ හොඳම කාලය සහ ඊට හේතුව** :- ඉස්කෝලෙ කාලේ ඒකෙනුත් 9 -10 පංතිවල ගත කරපු කාලේ ඒ වගේ සැහැල්ලු සුන්දර කාලයක් ආයේ ජීවිතයට එන්නෙ නෑ

- **ජීවිතයට අහිමි වුණු වටිනාම පුද්ගලයා හෝ අවස්ථාව** :- මට උපාධිය ලබා ගන්න තිබුණු අවස්ථාව අහිමි වීම ගැන හිතේ දුකක් තියෙනවා.ඒත් මම මේ වෙනකොට විවෘත විශ්ව විද්‍යාලයේ කළමනාකරණ උපාධිය තුන් වන වසර හදාරනවා. ලබන අවුරුද්දෙදි මගේ ඒ පසුතැවිල්ලත් නැතිවේවි.

- **හරි ගස්සා ගන්න අවස්ථාවක් ලැබුනොත් ඔබ වෙනස් කරගන්නා ඔබේ දුර්වලතා** :- සමහර වෙලාවට සමහර දේවල් කල් දාන පුරුද්දක් මට තියෙනවා. පෞද්ගලික ජීවිතයට තමයි මේක වඩාත්ම වලංගු. ඒ නිසාම මගේ ඒ දුර්වලතාවෙන් වැඩියෙන්ම දුක් වෙන්නෙ ගෙදර මගේ සමීපතමයන්.

- **ඔබ හිතන විදිහට ඔබ වඩාත්ම කුසලතාවන් ප්‍රකට කරන්නේ** :- කළමනාකරණ ක්ෂේත්‍රය තුළ මම වඩාත් මගේ කුසලතා ප්‍රකට කරනවා කියලයි මම හිතන්නේ.

- **ඔබේ ජීවිතයේදි හමුවූ වඩාත්ම ආකර්ශනීය පුද්ගලයා, ඔහුතුළ ඔබ දකින සුවිශේෂීතාවය** :- මගේ අම්මා.මගේ ජීවිතයේ ලබපු හැම ජයග්‍රාහනයකදිම ඇය මගේ පසුපස හිටියා. මිනිහෙක්ට හිතුවොත් ඕන දෙයක් කළ හැකියි කියලා ඇය නිතරම කියනවා. ඒ සඳහා මාව දිරි ගන්වනවා.

- **පළමු ආදර අත්දැකීම ජීවිතයට බලපෑ අන්දම** :- 2006 වාටඩ් ක්ලාස් යන කාලේ ඉස්කෝලෙ යන ළමයෙක් එක්ක පුංචි මිත්‍රත්වයක් තිබුණත් කාලයත් එක්ක ඒක එහෙමම නැති වෙලා ගියා . ඒ නිසා ඒක ආදරයක් කියන්න බෑ. සැබෑ ආදර හැඟීමක් මට දැනුණේ යසාරා මධුභාෂිණී නිසා . ඒ මගේ බිරිඳ.

- **එම පුද්ගලයාගේ ඔබ දකින සුවිශේෂීතාව** :- අම්මා වගේම ඇය මට ශක්තියක්. මගේ අධ්‍යාපන කටයුතු වලට ඇයගෙන් ලැබෙන සහාය වගේම ඒ ආදරයත් මට ලොකු ශක්තියක්.

- **ඔබ ඔබේ ජීවිතය ගැන තෘප්තිමත්ද** :- ඇත්තෙන්ම. මම ජීවිතේ ගැන බරපතලෙට හිතන්නේ නෑ.සැහැල්ලුවෙන් ජීවිතය ගෙවනවා.

- **ඔබේ ජීවිතය වෙනස් කළ හැරවුම් ලක්ෂයය (Terning Point)**:- ග්‍රාමීන් සමාගමේ රැකියාව කරන්න තෝරා ගැනීම වගේම වෙනත් අවස්ථා ලැබිලත් ඒ අවස්ථා භාර නොගැනීම. ගෙයක් දොරක් හදාගෙන වාහනයක් අරන් ලස්සන පවුල් ජීවිතයක් ගෙවන්න අවස්ථාව මේ රැකියාව විසින් මට උදාකරදී තියෙනවා.

- **ඔබේ ප්‍රියතම ගායකයා** :- ග්‍රේෂන් ආනන්ද

- **ගීතය** :- තරු යායේ ඈතින් ඈතට දිදුලන

- **චිත්‍රපටිය** :- සිරි පැරකුම්
- **කෘතිය** :- ෂර්ලෝක් හෝම්ස් කථා මාලාවට මම කැමතියි.
- **අනාගත ඉලක්කය** :- ලොකු ඉලක්ක නෑ.රැකියාව හොඳින් කරගෙන මගෙන් අනිත් අයට සහ රටට ඉටුවිය යුතු යුතුකම් කරගෙන හොඳින් ඉන්න ලැබුනොත් ඒ ඇති.■








සටහන
මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි

ගමන කෙතරම් හෙමින් උවත් නොනවත්වා යන්න.

# දැනුම වඩන්නයි - තෑගි දිනන්නයි මෙහෙවර පැණසර

## ප්‍රහේලිකා අංක - 07

**ජයග්‍රාහකයින් තිදෙනෙකුට සදීපා ප්‍රකාශකයෝ වෙතින් රුපියල් 3000 වටිනා පොත් කට්ටල තුනක්**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | | 2 | | | | |
| | | | | | 11 | 6 |
| 3 | | | | | | |
| | | | | 10 | | |
| | 4 | | 7 | | | |
| | | | | | | |
| 5 | | | | | 12 | |
| 8 | | | 9 | | | |

උපකාරක පද

**හරහට**

1. ජේ.කේ. රෝලින් විසින් රචිත සුප්‍රසිද්ධ කෘතියකි.
3. සිත්ගන්නා සුළු, ආකර්ශනීය යන අරුත් දේ.
4. කණ කැස්බෑවා..........අහස බලන්නා වාගේ.
5. කඩුව යන්නට සමාන පදයකි.
8. මේවා දීමෙන් මුදලත් මිතුරාත් අහිමි වේ.
9. ශ්‍රී ලංකාව මෙයට ආසන්නයේ පිහිටා ඇත.
11. ශරීරයේ අභ්‍යන්තර විශාලතම ඉන්ද්‍රිය මෙය වේ.

**පහළට**

1. විළියම් ශේක්ෂ්පියර් විසින් රචිත ශෝකාන්ත නාට්‍යයකි.
2. විශාලත්වය අතින් ලොව 69 වන රට වන මෙය මධ්‍යම යුරෝපයට අයත් රටකි.
4. සුප්‍රකට නවකතාවක් ඇසුරෙන් තිස්ස අබේසේකර විසින් අධ්‍යක්ෂණය කළ සම්මානනීය චිත්‍රපටියකි.
5. පංචේන්ද්‍රියන්ගෙන් එකකි.
6. පුරාණයේ මිනිසුන් මේ රජු දෙවියකු ලෙස ඇදහීය.
7. වසර සියයක කාලය මෙනමින් හැඳින්වේ.
10. උස්බිම් මෙනමින් හැඳින්වේ.
12."ඇදය" යන අරුත් දේ

නම : .................................... සේවක අංකය : ..........................
ශාඛාව : .......................................... ප්‍රහේලිකාව පිරවූයේ වෙනත් අයෙකු නම් ඔහුගේ / නම : ..................................................
ඥාති සම්බන්ධය : ..............................................................
දිනය : .................................. අත්සන : ..................................

මෙහෙවර පැණසර ප්‍රහේලිකාවේ බහුතරයක් උපකාරකයන් සැකසෙනුයේ මෙවර මෙහෙවර පුවත්පතේ පළව ඇති ලිපි වල අඩංගු කරුණු ඇසුරිනි. එම ලිපි කියැවූ ඔබට මෙම ප්‍රහේලිකාව පිරවීම කිසිසේත්ම අසීරු නොවනු ඇත. HNB ග්‍රාමීන් කාර්ය මණ්ඩලය හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට මෙම තරඟය සඳහා සහභාගී විය හැකි අතර නිවැරදිව ප්‍රහේලිකාව පුරවා එවන්නන් අතරින් කුසපත් ඇදීමෙන් තෝරා ගන්නා ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් තිදෙනෙකුට සදීපා පොත් ප්‍රකාශකයෝ වෙතින් අගනා පොත් පාර්සල් 3 ක් පිරිනමන අතර, ඔබගේ විසඳුම් ලබන මස 3 වන සතියට පෙර සංස්කාරක - මෙහෙවර පැණසර, HNB ග්‍රාමීන් අංක 168, නාවල පාර, නුගේගොඩ ලිපිනයට ලැබෙන්නට සලස්වන්න.

## මේ අයත් නිවැරදි විසඳුම් එවා තිබුණා

ආර්.එම් දීපිකා වැලිමඩ ශාඛාව, අයි.එල්.සංජීව ප්‍රධාන කාර්යාලය, ආර්.ඩී. එස්.ප්‍රියංකර නිකවැරටිය ශාඛාව , එස්.පී.එන්.එම්. යසරත්න හෝමාගම ශාඛාව තිළිණි කල්පනා ප්‍රධාන කාර්යාලය, , එන්.ඒ.එස්.අයි.එල්. නාපාගොඩ,මහනුවර ශාඛාව,අමල් තිලංක ප්‍රධාන කාර්යාලය,පී.කේ. අමිල ප්‍රභාත්,ප්‍රධාන කාර්යාලය,ඩී.එන් .බී.ආර් හේෂානි,බෙලිඅත්ත,ආර්.ඩී. ශානක, ප්‍රධාන කාර්යාලය තරිදු. මහියංගණය ශාඛාව,ජී.අයි.ටී.මධුජිත්,රත්නපුර ශාඛාව,එම්.පී. රුසිරු ප්‍රේමලාල්,කන්තලේ ශාඛාව,,එම්. ජී. එස්. බණ්ඩාර, නාවල පිටිය ශාඛාව, ඩබ්.ක්‍රිශාන් ප්‍රධාන කාර්යාලය ,කේ. ඩී. සුජිත් කුමාර. වත්තල ශාඛාව, කේ.එම්. රුමේෂ් , නාවලපිටිය, එම්.යූ.එස්. ධර්මවර්ධන ප්‍රධාන කාර්යාලය, කේ.සී. සමරවික්‍රම, වෙන්නප්පුව ශාඛාව, ,ඔකඳ ජයසිංහ, ප්‍රධාන කාර්යාලය, ආර්.එම්.ටී ධනුෂ්ක, මහියංගනය ශාඛාව,පී.. එම්. යූ. කුමාරි,කන්තලේ ශාඛාව,බී.එල්.සී.මධුෂානී,ප්‍රධාන කාර්යාලය,තරුසි හාසිනි., ප්‍රධාන කාර්යාලය ,චතුරංග,මැදවච්චිය ශාඛාව,ඩබ්.එම්.ප්‍රබුද්ධ, ප්‍රධාන කාර්යාලය,එම්.ඒ.ඩී.ධනුෂාන්,වත්තල ශාඛාව,ආර්.රසාංජලී, ප්‍රධාන කාර්යාලය,ඒ.ටී පුෂ්පනාත්, ප්‍රධාන කාර්යාලය,රජිත් ධර්මප්‍රිය, ප්‍රධාන කාර්යාලය,ඩී.එන් සමරවීර,මැදවච්චිය ශාඛාව, එස්.ආර්. දිල්රුක්, ප්‍රධාන කාර්යාලය,ඉන්දීවරී ගුණවර්ධන, ගම්පහ ශාඛාව,රුක්ෂාන් අමරසේකර, ප්‍රධාන කාර්යාලය,සී.බී. හරිස්චන්ද්‍ර, ප්‍රධාන කාර්යාලය,ටී.ඒ.පී.ලාල්,ගම්පහ ශාඛාව,ටී.එම්.ප්‍රේමලාල්, හලාවත ශාඛාව

## "මෙහෙවර පැණසර" මැයි - ජුනි කලාපයේ ජයග්‍රහකයෝ

HNB ග්‍රාමීන් මෙහෙවර පුවත් සඟරාවේ "පැණසර" ප්‍රහේලිකාව විසඳා එවා ජයග්‍රහණය කළ ජයග්‍රාහකයන්ගේ නම් පහත පළ වේ. සදීපා ප්‍රකාශකයන් විසින් පිරිනමනු ලබන රු. 3000 වටිනා පොත් කට්ටල නුදුරු දිනකදීම ඔබ වෙත ලැබෙනු ඇත. අපේ උණුසුම් සුබ පැතුම්...



එම්.එච්.සී.එන්. ප්‍රනාන්දු
කුලියපිටිය ශාඛාව,



චාමර පීරිස්
ප්‍රධාන කාර්යාලය,



ශහිනි තාරිකා
ප්‍රධාන කාර්යාලය,



මෙහෙවර පැණසර ප්‍රහේලිකාව පරවා එවීමට ඔබ දක්වන උනන්දුව දිනෙන් දිනම ඉහළ යන බව සීඝ්‍රයෙන් වැඩිවන ඔබේ විසදුම් පත් ප්‍රමාණය සාක්ෂි දරනවා.පසුගිය කලාපයේ පළවූ මෙහෙවර පැණසර ප්‍රහේලිකාව පුරවා එවූ ඔබ අතරින් කුසපත් ඇදීමෙන් තෝරා ගත් ජයග්‍රූහකයින් තිදෙනාගේ නම් ඉහත දැක්වෙනවා. මෙවර මෙහෙවර ජයග්‍රහකයින් තේරීම සඳහා අප හා එක්වූ HNB ග්‍රාමීන් සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(ශාඛා ජාල) ඇනස්ලි ප්‍රනාන්දු සහකාර සාමාන්‍යාධිකාරීවරුන් වන පැතුම් සම්පත් කුරේ,ප්‍රභාත් කත්‍රිආරච්චි යන මහත්වරුන්ට අපගේ ස්තුතිය.

සදීපා
• පොත් ප්‍රකාශනය • ප්‍රින්ට් හවුස්
• පොත් හල • ප්‍රින්ටර්ස්

සම්මානලාභී බෞද්ධ, සාහිත්‍ය හා අධ්‍යාපන පොත් ප්‍රකාශකයෝ

Sole Agent in Sri Lanka
PELANGI
Penerbitan Sdn. Bhd.
Malaysia.

කුඩා ළමුන්ට මුල සිට සරලව ඉංග්‍රීසි ඉගෙනීම සඳහා මැලේසියාවෙන් ගෙන්වන Phonics පොත් පෙළ

සී/ස සදීපා ප්‍රකාශකයෝ
SADEEPA PUBLISHERS (PVT) LTD
1060, මරදාන පාර, බොරැල්ල

දුරකථන : 011-2686114, 2694289, 2678043
ෆැක්ස් : 011-2678044
Email : sadeepapub@gmail.com

හෙට ඔබ රජ වුවත් අද සාමාන්‍ය වැසියෙකු ලෙස සිටින්න.

# Atlas සිත්තර යාළු
# පුංචි අපේ චිත්‍ර පිටුව

''සිත්තර යාළු'' චිත්‍ර පිටුව වෙන්වෙලා තියෙන්නේ එච් එන් බී ග්‍රාමීන් කාර්ය මණ්ඩලයේ ඔබේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළි දැක්වීම පිණිසයි. ''සිත්තර යාළු චිත්‍ර පිටුවෙහි පළවන චිත්‍ර අතරින් **තෝරා ගනු ලබන හොඳම චිත්‍ර තුනක් සඳහා සිලෝන් පෙන්සිල් කොම්පැණි (ඇට්ලස්) මගින් පිරිනමනු ලබන වටිනා ත්‍යාග කට්ටල තුනක් පිරිනමනු ලබන** අතර ඔබගේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළිදක්වාලීමට ලැබෙන මේ මාහැඟි අවස්ථාව ප්‍රයෝජනයට ගෙන **ඔබේ දරුවාගේ චිත්‍ර නිර්මාණ සංස්කාරක, චිත්‍ර පිටුව, එච් එන් බී ග්‍රාමීන් ගොඩනැගිල්ල, අංක 168, නාවල පාර , නුගේගොඩ. යන ලිපිනයට නොපමාව යොමු කරන්න.**



**මගේ ගෙවත්ත**
**නෙත්මි තරුෂිකා ගංගා මදනායක - 4 ශ්‍රේණිය**
(ජාත්‍යානතර පාසල - වැලිමඩ)



**මල් වත්ත**
**අයි තරුලි ලියන්සා - 3 ශ්‍රේණිය**
(මෙතෝදිස්ත ප්‍රාථමික විදුහල)
(අයි ලසන්ත සංජීව) - ප්‍රධාන කාර්යාලය)



**අපේ ගෙදර වෙසක්**
**නිදුක දෙනෙත් සේනාරත්න - 2 ශ්‍රේණිය**
(තේරී විදුහල - කොළඹ)
(කසුන් උපෙන්ද්‍ර සේනාරත්න - කෑගල්ල ශාඛාව)



**පොසොන් අසිරිය**
**එස් එම් නිතිනි දිනෙත්මා - 1 ශ්‍රේණිය**
( මහේෂ් උදය - අම්බලන්ගොඩ)



**ගම්මානය**
**ආර් එම් සොනක්ෂි සත්මිනි - 2 ශ්‍රේණිය**
(ලයිසියම් ජාත්‍යන්තර පාසල - නුවරඑළිය)



**පැරෂුටය**
**සඳුප හසරුල් රණවිර - 3 ශ්‍රේණිය**
(ඩී එස් සේනානායක විදුහල - කොළඹ -07)
(කමල් ප්‍රියංග - ප්‍රධාන කාර්යාලය)

## අපේ හෘදයාංගම සුබ පැතුම් සමගින්....



චමර තරංග පීරිස



ක්‍රිශාන් ප්‍රනාන්දු



ඔකඳ ජයසිංහ

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මගින් මෙහෙයවනු ලබන එක් වසරක පාඨමාලාවක් වූ අලෙවිකරණ කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (Diploma in Marketing Management ) HNB ග්‍රාමීන් ෆිනෑන්ස් සමාගමේ ප්‍රධාන කාර්යාලයේ ස්ථාවර තැන්පතු අංශයේ චාමර තරංග පීරිස් - (එම වසරේ හොඳම ප්‍රතිඵල)ක්‍රිශාන් ප්‍රනාන්දු (ඉතුරුම් අංශය) සහ ඔකඳ ජයසිංහ (ඉතුරුම් අංශය) යන මහත්වරුන් විසින් ඉතා උසස් අන්දමින් සමත් ව ඇති බව සිහිපත් කරන්නේ HNB ග්‍රාමීන් පවුලේ හෘදයාංගම සුබ පැතුම්ද ඔබ තිදෙනාට මෙසේ පිළිගන්වමිනි.

## "Atlas සිත්තරයාළු"

**සිත්තර යාළු මැයි - ජුනි කලාපයේ ජයග්‍රාහකයෝ**

❖ වනයක අසිරිය
**ආර්. එම්. ලකිඳු තේනුර**
**(මහින්ද තිස්ස - ප්‍රධාන කාර්යාලය)**

❖ මගේ මාළු ටැංකිය
**ටී.එම්. සෙනුමි යුතාරා දම්සරණී**
**(ටී.එම්.ආර් ප්‍රේමලාල් - හලාවත ශාඛාව)**

❖ අක්කයි මමයි
**මෙතායා හිමංදී**
**( සුදේශ් පෙරේරා - ප්‍රධාන කාර්යාලය)**

**ඔබ දෙන දේ ඔබටම ආපසු ලැබේ. ගෞරවයද එසේමය**

© Alexander Karpenko 2009 | aik-art.deviantart.com

# Great Place to Work සම්මානය HNB ග්‍රාමීන් සමාගමට



## අපගේ කාර්ය මණ්ඩලය අප සතු අගනාම සම්පත බව අපි තහවුරු කළෙමු..

**ශ්‍රී ලංකීය මූල්‍ය ක්ෂේත්‍රය තුළ වසර හයක් වැනි කෙටි කාලයකදී එච්.එන්.බී.ග්‍රාමීන් සමාගම ගෞරවාන්විත සම්මාන තුනක් තමා සතුකර ගැනීමට පසුගිය ජූනි 28 දා පවත්වන ලද "ග්‍රේට් ප්ලේස් ටු වර්ක්" සම්මාන උළෙලේදී සමත් විය.**

සමාගම ආරම්භ කළදා පටන් ගතවූ ඉතිහාසය තුළ පළමු වරට විනිශ්චයට භාජනය කරන ලදුව, මෙම වසරේ 'ප්‍රිය මනාප සේවා ස්ථානය' නම් විරුදාවලිය



ලබාදෙන ග්‍රේට් ප්ලේස් ටු වර්ක් සම්මානය ලද ශ්‍රී ලංකාවේ සමාගම් 25 අතරට එක්වීමේ ගෞරවය දිනා ගැනීමට මෙන්ම ශ්‍රී ලංකාවේ ප්‍රමුඛපෙළේ සමාගම් 106 ක් අතරින් අභිමානනීය වූද නිර්දේශය සඳහා සුදුසු වූද හොඳම ආයතනය (**Best in Pride & Advocacy**) ට හිමි සම්මානයෙන්ද ''රැකියාව සඳහා යෝග්‍යතම ස්ථාන''විමසා බැලෙන තරග කාණ්ඩය යටතේ මහා පරිමාණ සමාගම් අතරින් තුන්වන ස්ථානයද ("**Great Place to Work**") **HNB** ග්‍රාමීන් සමාගමට හිමිවිය. මෙලෙස අත්පත් කරගත් සාර්ථකත්වය පිළිබඳ එච්.එන්.බී.ග්‍රාමීන් සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂ හා ප්‍රධාන විධායක නිලධාරී චමින්ද ප්‍රභාත් මහතා මෙසේ සිය අදහස් දැක්වීය.

'' මෙම සම්මානය පළමු වරට දිනාගත් ආයතනයක් වශයෙන් අපට මෙහි පවත්නා වටිනාකම වන්නේ අප අපගේ ගනුදෙනුකරුවන් අතර පමණක් නොව අපගේම පිරිස් අතරද ලද පිළිගැනීම හරහා අත්පත් කරගත් සාර්ථකත්වයයි. එය සැබැවින්ම පසුගිය වසර ගණනාව පුරා එච්.එන්.බී. ග්‍රාමීන් සමාගමේ ජීවනාලිය වන අපගේ කාර්ය මණ්ඩලය සිය හදින් හා ආත්මයෙන් කළ කැපවීම පිළිබඳ සාක්ෂියයි. , මෙම සම්මානය තුළින් ''පැතුම් ඔක්කොම සැබෑ කරවන, අපේ දෙවන නිවහනණී ("ஆசியெல்லாம் என்றும் நிலையாக – வந்து சேர்ந்திடும் நமது இல்லமே") යනුවෙන් වූ අප ආයතනයේ තේමා පාඨය වෙත නියම වටිනාකම ලබාදෙමින් තමා යෙදී සිටින කාර්යය වෙතද අපගේ කාර්ය මණ්ඩලය සිය බැඳීම ප්‍රකට කර ඇත. HNB ග්‍රාමීන් සමාගම පිළිබඳව වූ අප කාර්ය මණ්ඩලයේ හැඟීම් අපව එසේ සම්මානනීය කරද්දී අනෙක් අතින් මහ බැංකුව මගින් අවසන් වරට කරන ලද මහ බැංකු වර්ගීකරණයේදී බැංකු නොවන මූල්‍ය ආයතන අතර පස්වන ස්ථානය HNB ග්‍රාමීන් සමාගමට හිමිවීම මා දකිනුයේ මූල්‍ය කළමනාකාරීත්වය අතින් අප පෙන්නුම් කළ පරිපූර්ණත්වය සේම සේවා සැපයීමේදී දක්වන ලද විශිෂ්ඨත්වය එවන් ස්ථානයකට අප ඔසවා තැබූ බවයි.

ග්‍රාමීන් සමාගම ඉන් පෙර වසර කිහිපය තුළ අත්විඳි අමිහිරි අත්දැකීම් හා සසඳන විට වසර හයක් වැනි කෙටි කාලයක් තුළදී අප ලද මෙම ජයග්‍රහන ආශ්චර්යකැයි ඇතැමෙකුට සිතිය හැකි නමුත් එය හුදෙක් අප කණ්ඩායමේ සාමූහිකත්වයේ සහ උත්සාහයේ ප්‍රතිඵලයක් බව මට රහසක් නොවෙයි. අප අපගේ රැකියාවට දක්වන ආදරය සහ මේ අපේ දෙවන නිවස ලෙස සලකා කරනු ලබන කැපකිරීම් සහ වෙහෙසවීම් අප ජයග්‍රාහී මාවත තෙක් ඔසවා තැබූ බවයි මගේ පෞද්ගලික අදහස.

අප ආයතනය ආරක්ෂාකරගත යුතුම මොහොතේ මූල්‍ය ආයෝජනය කරමින් ආයතනය වැටී තිබුණු තත්වයෙන් ගොඩ ගැනීමට ඇප කැප වූ හිටපු සභාපති බී. ප්‍රේමලාල් මහතා සහ නියෝජ්‍ය සභාපතිනි සඳමිණි පෙරේරා මහත්මිය මෙහිදී විශේෂයෙන් කෘතගුණ පූර්වකව සිහිපත් කළ යුතුයි ඒ ඔවුන් නොසිටින්නට අද අප ලබන මේ කිසිවක් අපට හිමි නොවන්නට ඉඩ තිබූ නිසයි. ඒ වගේම HNB ග්‍රාමීන් හි වත්මන් සභාපති ජොනතන් අලස් මහතාගෙන්, උප සභාපති බී.ප්‍රේමලාල් මහතාගෙන් සහ සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලයෙන්



ලැබෙන නායකත්වය හා මග පෙන්වීමත් HNB ග්‍රාමීන් සමාගම සම්මානනීය තත්වයට ඔසවා තැබීමට මහෝපකාරී වූ බව මගේ හැඟීමයි.එසේම **HNB** ග්‍රාමීන් සමාගම වෙත මෙම සම්මාන හා ජයග්‍රහන දිනා ගැනීමට මග හෙළි කළ අප කාර්යමණ්ඩලයටත් මගේ හෘදයාංගම ස්තූතිය පුද කිරීමට මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

HNB GRAMEEN මෙහෙවර
එච් එන් බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්
නො :168 නාවල පාර
නුගේගොඩ
ටෙලි : 0112176262 ෆැක්ස් : 0112825843
ඊ-මේල් :- manjula.p@hnbgrameen.lk
වෙබ් :- www.hnbgrameen.com

අධීක්ෂණය :- චමින්ද ප්‍රභාත්
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී
ප්‍රධාන කර්තෘ :- මංජුල ප්‍රභාත් හෙට්ටි ආරච්චි
පිටු සැලසුම් :- කණිෂ්ක විජේතුංග
ඡායාරූප ශිල්පි :- සුරංග කුරුප්පුආරච්චි
මුද්‍රණය :- අර්ජුන ග්‍රැෆික්ස්

## HAPPY BIRTHDAY

අගෝස්තු මාසයේ උපන්දිනය සමරන
එච් එන් බී ග්‍රාමීන් සමාගමේ සහෝදර සේවක මහත්ම මහත්මීන් වෙත
අපගේ හෘදයාංගම සුබ පැතුම් මේ සමග පිරිනමමු !

| නම | දිනය | ශාඛාව |
|---|---|---|
| ඩී. බාලකොකුලන් මහතා | අගෝස්තු 01 | කිලිනොච්චි |
| උපුල් සාන්ත කුමාර මහතා | අගෝස්තු 02 | පොතුවිල් |
| අනුර ලක්සිරි මහතා | අගෝස්තු 02 | බෙලිඅත්ත |
| එල්. රාශීව් මහතා | අගෝස්තු 02 | මල්ලාවි |
| ලක්ෂික මධුජීව මහතා | අගෝස්තු 02 | බණ්ඩාරවෙල |
| සී. ක්‍රිශාන්තන් මහතා | අගෝස්තු 02 | වලපනේ |
| මොහොමඩ් මුර්ෂිඩ් මහතා | අගෝස්තු 02 | ප්‍රධාන කාර්යාලය |
| අමල් ඉංදික මහතා | අගෝස්තු 02 | නුවරඑළිය |
| ලලිත් ද සිල්වා මහතා | අගෝස්තු 03 | නුවරඑළිය |
| එම්.ඊශ්වරන් මහතා | අගෝස්තු 03 | මඩකලපුව |
| විශ්ව ඩිල්ශාන් මහතා | අගෝස්තු 03 | හලාවත |
| ප්‍රියන්ත උදය කුමාර මහතා | අගෝස්තු 03 | ප්‍රධාන කාර්යාලය |
| ගයනි කෞශල්‍යා මෙනෙවිය | අගෝස්තු 03 | මැදවච්චිය |
| ඩිල්ෂාන් ප්‍රමෝද්‍ය මහතා | අගෝස්තු 03 | නගර ශාඛාව |
| ඒ .ආර් එම්.ජම්සිත් මහතා | අගෝස්තු 04 | පොතුවිල් |
| අයේෂා උපමාලි මෙනෙවිය | අගෝස්තු 04 | පිටිගල |
| සජිත් ප්‍රියංකර මහතා | අගෝස්තු 04 | ගලෙන්බිදුණු වැව |
| ඩී. ඩිලෝජන් මහතා | අගෝස්තු 04 | මන්නාරම |
| සුදත් ගුණරත්න මහතා | අගෝස්තු 05 | නාවලපිටිය |
| ජේ. අභිෂේක් මහතා | අගෝස්තු 05 | කුලියාපිටිය |
| දිනූෂ පෙරේරා මහතා | අගෝස්තු 05 | නගර ශාඛාව |
| විශ්ව පෙරේරා මහතා | අගෝස්තු 06 | ප්‍රධාන කාර්යාලය |
| වයි. සුජර්මන් මහතා | අගෝස්තු 06 | අම්පාර |
| ලක්ෂාන් මධුශංක මහතා | අගෝස්තු 06 | නගර ශාඛාව |
| අමිල විජේසිරි මහතා | අගෝස්තු 06 | ප්‍රධාන කාර්යාලය |
| ඩී. ඩිල්ශාන් මහතා | අගෝස්තු 06 | මොනරාගල |
| මාධව ප්‍රේමරත්න මහතා | අගෝස්තු 07 | ගල්ගමුව |
| තිලාන් අනුර මහතා | අගෝස්තු 07 | මොනරාගල |
| රවීන්ද්‍ර පෙරේරා මහතා | අගෝස්තු 07 | රත්නපුර |
| පී තිලකේෂ්වරන් මහතා | අගෝස්තු 08 | වවුනියා |
| සනත් නන්දන මහතා | අගෝස්තු 08 | මහියංගනය |
| චානක මධුරංග මහතා | අගෝස්තු 08 | හෝමාගම |
| තුෂාර සංජීව මහතා | අගෝස්තු 08 | මතුගම |
| මහේෂ් චතුරංග මහතා | අගෝස්තු 08 | හලාවත |
| මොහොමඩ් ශයාම් මහතා | අගෝස්තු 08 | කල්මුණේ |
| ජනක බණ්ඩාර මහතා | අගෝස්තු 09 | දඹුල්ල |
| නිශාන්ත බණ්ඩාර මහතා | අගෝස්තු 09 | නුවර |
| රමිත සිල්වා මහතා | අගෝස්තු 09 | වෙන්නප්පුව |
| සම්පත් කුමාර පීරිස් මහතා | අගෝස්තු 09 | ප්‍රධාන කාර්යාලය |
| ලහිරු දුලාන් මහතා | අගෝස්තු 10 | කළුතර |
| රජික ලක්මාල් මහතා | අගෝස්තු 10 | දඹුල්ල |
| ප්‍රභාත් වීරසිංහ මහතා | අගෝස්තු 10 | රත්නපුර |
| සම්පත් ගමගේ මහතා | අගෝස්තු 10 | බණ්ඩාරගම |
| ඉෂාන් මධුරංග මහතා | අගෝස්තු 11 | නොච්චියාගම |
| ලලිත් වසන්ත මහතා | අගෝස්තු 12 | හම්බන්තොට |
| සුරංග ජයලාල් මහතා | අගෝස්තු 12 | පොළොන්නරුව |
| දීඝායු චිත්‍රසේන මහතා | අගෝස්තු 12 | කළුතර |
| සමීර ශ්‍රීලාල් මහතා | අගෝස්තු 12 | බණ්ඩාරගම |
| මහේෂ් කුමාර මහතා | අගෝස්තු 13 | ප්‍රධාන කාර්යාලය |
| ආසිරි උදයකුමාර මහතා | අගෝස්තු 13 | අවිස්සාවේල්ල |
| ආර්. තිරුචෙල්වම් මහතා | අගෝස්තු 13 | නුවරඑළිය |
| අසංක ඉංදික මහතා | අගෝස්තු 13 | අම්බලන්ගොඩ |
| උදේශ් හශාන් මහතා | අගෝස්තු 13 | මීගමුව |
| තිලාන් දිනේෂ් මහතා | අගෝස්තු 13 | අනුරාධපුර |
| ටී සුරේන් මහතා | අගෝස්තු 13 | නැදුන්කාර්ණි |
| ලසිත මධුශංක මහතා | අගෝස්තු 13 | දෙහිඅත්තකණ්ඩිය |
| නුරේෂ් ප්‍රනාන්දු මහතා | අගෝස්තු 14 | ජාඇල |
| අමිල බුද්ධික මහතා | අගෝස්තු 14 | මීගමුව |
| කේ කාන්දීපන් මහතා | අගෝස්තු 14 | ත්‍රිකුණාමලය |
| සම්මික ගුණවර්ධන මහතා | අගෝස්තු 14 | ගල්ගමුව |
| ජාන් සන්දුක මහතා | අගෝස්තු 14 | තිස්සමහාරාමය |
| එස්. දර්ශන් මහතා | අගෝස්තු 14 | මඩකලපුව |
| ඇන්ටන් ජෙයරාජ් මහතා | අගෝස්තු 14 | මන්නාරම |
| චතුර ප්‍රදීප් මහතා | අගෝස්තු 15 | ප්‍රධාන කාර්යාලය |
| සුපුන් ලක්ෂිත මහතා | අගෝස්තු 15 | පිටිගල |
| රෝෂණි මෙන්ඩිස් මහත්මිය | අගෝස්තු 16 | මොරටුව |
| සිවපාතන් කජීපන් මහතා | අගෝස්තු 16 | යාපනය |
| දිනේෂ් කුමාර මහතා | අගෝස්තු 17 | වත්තල |
| නිලන්ත කුමාර මහතා | අගෝස්තු 17 | කුලියාපිටිය |
| අනුරුද්ධ පොන්නම්පෙරුම මහතා | අගෝස්තු 17 | ප්‍රධාන කාර්යාලය |
| දිනේෂ් ලක්මාල් මහතා | අගෝස්තු 17 | පදවිය |
| කුබේන්ද්‍ර රාජා මහතා | අගෝස්තු 17 | වත්තල |
| චාමර බණ්ඩාර මහතා | අගෝස්තු 17 | නුවර |
| ඉරෝෂණ ගුණසේකර මහතා | අගෝස්තු 17 | හොරණ |
| සංජය පෙරේරා මහතා | අගෝස්තු 17 | බදුල්ල |
| සම්පත් සමරප්පුලි මහතා | අගෝස්තු 17 | ප්‍රධාන කාර්යාලය |
| අසේල ඉන්ද්‍රජිත් මහතා | අගෝස්තු 18 | නුවර |
| දිනේෂ් රොෂාන් මහතා | අගෝස්තු 18 | කන්තලේ |
| සුජිත් තිලන්ත මහතා | අගෝස්තු 18 | පදවිය |
| තරංග තාරක මහතා | අගෝස්තු 18 | හොරණ |
| ප්‍රභාෂන් මධුමාධව මහතා | අගෝස්තු 18 | ඇඹිලිපිටිය |
| අසංක විජේසිංහ මහතා | අගෝස්තු 19 | පදවිය |
| මලින්ත ප්‍රනාන්දු මහතා | අගෝස්තු 19 | ජාඇල |
| පත්මකුමාර කොන්තසිංහ මහතා | අගෝස්තු 20 | ප්‍රධාන කාර්යාලය |
| අනුරුද්ධ බණ්ඩාර මහතා | අගෝස්තු 20 | මාතලේ |
| හිමන්ත මධුශංක මහතා | අගෝස්තු 20 | ප්‍රධාන කාර්යාලය |
| ජේ. ගුණසීලන් මහතා | අගෝස්තු 20 | මල්ලාවි |
| වික්‍රමරත්න විජේසිංහ මහතා | අගෝස්තු 20 | බදුල්ල |
| දිනේෂ් කුමාර මහතා | අගෝස්තු 21 | ප්‍රධාන කාර්යාලය |
| ක්‍රිස්ටෝපර් රණසිංහ මහතා | අගෝස්තු 21 | නිට්ටඹුව |
| කේ. ජීවන්තන් මහතා | අගෝස්තු 21 | මඩකලපුව |
| කාවින්ද සපුමල් මහතා | අගෝස්තු 21 | මහියංගනය |
| එස්.විජේරතිනම් මහතා | අගෝස්තු 21 | මල්ලාවි |
| මුදිත ජයනාත් මහතා | අගෝස්තු 21 | නුවර |
| නෙවිල් ශයාමන් මහතා | අගෝස්තු 22 | කුරුණෑගල |
| චරන්ද වීරසිංහ මහතා | අගෝස්තු 22 | ප්‍රධාන කාර්යාලය |
| මධුරංග කරුණාරත්න මහතා | අගෝස්තු 22 | මාතර |
| ක්‍රිශාන්ත බණ්ඩාර මහතා | අගෝස්තු 22 | බණ්ඩාරගම |
| අජිත් ප්‍රියන්ත මහතා | අගෝස්තු 23 | ප්‍රධාන කාර්යාලය |
| ඉංදික ප්‍රසන්න මහතා | අගෝස්තු 23 | මාතලේ |
| අර්නස්ට් ශ්‍රීමාල් මහතා | අගෝස්තු 23 | බෙලිඅත්ත |
| දර්ශන පුෂ්පකුමාර මහතා | අගෝස්තු 23 | කුලියාපිටිය |
| චානක සුරේෂ් මහතා | අගෝස්තු 23 | නුවර |
| ඇන්තනී ඩෙස්මන් මහතා | අගෝස්තු 23 | මන්නාරම |
| ශ්‍රීමල් ලක්ෂාන් මහතා | අගෝස්තු 23 | කැකිරාව |
| විජේසුන්දර දිසානායක මහතා | අගෝස්තු 23 | තිස්සමහාරාමය |
| ප්‍රියන්ත දිසානායක මහතා | අගෝස්තු 24 | ප්‍රධාන කාර්යාලය |
| රනිල් කුලතුංග මහතා | අගෝස්තු 24 | හලාවත |
| බණ්ඩාර විතානගේ මහතා | අගෝස්තු 24 | නුවර |
| ෂෙහාන් සිල්වා මහතා | අගෝස්තු 24 | ජාඇල |
| සුරංග ප්‍රදීප් මහතා | අගෝස්තු 25 | අවිස්සාවේල්ල |
| ඉංදික නදීශන් මහතා | අගෝස්තු 25 | ඇඹිලිපිටිය |
| මිචෙල් ටිබට් මහතා | අගෝස්තු 25 | ත්‍රිකුණාමලය |
| සංජීව සූරියබණ්ඩාර මහතා | අගෝස්තු 26 | කෑගල්ල |
| අනුර බාලසූරිය මහතා | අගෝස්තු 26 | ප්‍රධාන කාර්යාලය |
| මහේෂ් බුද්ධික මහතා | අගෝස්තු 26 | අවිස්සාවේල්ල |
| අයි. නිතරාසන් මහතා | අගෝස්තු 27 | මුලතිවු |
| ගමගේ අනුර මහතා | අගෝස්තු 28 | ප්‍රධාන කාර්යාලය |
| අරුණ ශාන්ත ප්‍රනාන්දු මහතා | අගෝස්තු 28 | ප්‍රධාන කාර්යාලය |
| හේෂාන් විජේසූරිය මහතා | අගෝස්තු 28 | ත්‍රිකුණාමලය |
| පුෂ්පකුමාර එදිරිසිංහ මහතා | අගෝස්තු 28 | හැටන් |
| සජිත් ඉංදික මහතා | අගෝස්තු 28 | අනුරාධපුර |
| සුජිත් කුමාර මහතා | අගෝස්තු 29 | ප්‍රධාන කාර්යාලය |
| දසුන් චතුරංග මහතා | අගෝස්තු 29 | අවිස්සාවේල්ල |
| ෂෙහාන් සඳරුවන් මහතා | අගෝස්තු 29 | හලාවත |
| අචිනි පෙරේරා මෙනෙවිය | අගෝස්තු 29 | කඩුවෙල |
| මධුරංග පීරිස් මහතා | අගෝස්තු 29 | වැලිමඩ |
| ඩිලාන් බුද්ධික මහතා | අගෝස්තු 29 | බෙලිඅත්ත |
| රුවන් ප්‍රදීප්කුමාර මහතා | අගෝස්තු 29 | කෑගල්ල |
| නලින් ප්‍රියංග මහතා | අගෝස්තු 30 | මතුගම |
| මලිත ගයාන් මහතා | අගෝස්තු 30 | මොරටුව |